Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථානුකූලව ගුරුවරුන්ගේ
කාර්යක්ෂමතාවය සඳහා වූ මොඩියුල ක්‍රියාත්මක කිරීම

# 03
# මොඩියුලය

# පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍යයා හඳුනා ගැනීම

2020

## ගම්පහ ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය


සැකසුම : එච්.එච්. හද්‍රා මානෙල් කුමාරි මිය - කළමනාකරු
එම්.ඒ.එම්. රිෆ්දි මයා - කථිකාචාර්ය
අසිත බස්නායක මයා - කථිකාචාර්ය


අධීක්ෂණ කටයුතු සහ මග පෙන්වීම : ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය





Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මෙම මොඩියුලය හැදෑරීමේ අරමුණු වනුයේ.....

1. පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය තුළ කළමනාකරණ සංකල්ප භාවිතය පිළිබඳව හඳුනා ගැනීම.

2. පන්ති කාමර කළමනාකරණ උපායමාර්ග හා යහපත් ව්‍යවහාර භාවිතය සඳහා යොමු වීම.

3. 21 වන සියවසට ගැලපෙන පන්ති කාමරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ගුරු කුසලතා සංවර්ධනය කිරීම.

4. සිසු ගැටලු, අභියෝගාත්මක චර්යා හා ශක්තීන් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීම.

5. විවිධ වයස් කාණ්ඩයට අයත් ශිෂ්‍යයන්ගේ ගති ලක්ෂණ හඳුනා ගැනීම.

6. ළමයා හා පරිසරය, ළමා වර්ධනය, අවශ්‍යතා අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රමවේද භාවිත කිරීම.

7. සෑම ශිෂ්‍යයෙකුම හොඳින් හඳුනාගෙන ඔවුන්ට ගැලපෙන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මෙම මොඩියුලය හැදෑරීමෙන් පසු

1 පන්ති කාමර කළමනාකරණය යන්න කුමක්දැයි පැහැදිලි ව ප්‍රකාශ කරයි.

2 කළමනාකරණ ක්‍රියාවලියේ පියවරයන් විවිධ උපාය මාර්ග හා ව්‍යවහර භාවිතයන් විධිමත් ව පන්ති කාමර කටයුතුවල දී භාවිතා කරයි.

3 පන්ති කාමර කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායී ව ක්‍රියාත්මක කරයි.

4 21 වන සියවසෙහි කුසලතාවලට සරිලන පරිදි ඉගැන්වීමේ ක්‍රම හා ප්‍රවේශයන් සංවර්ධනය කරයි.

5 ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ ප්‍රවේශයක් සඳහා වර්තමාන භාවිතයන් විශ්ලේෂණය කර වැඩි දියුණු කර ගනියි

6 සිසුන්ගේ චර්යාමය විවිධතා අනුව හඳුනා ගනියි.

7 සිසුන්ගේ විවිධතා වලට ගැලපෙන පරිදි විවිධ ඉගෙනුම් අවස්ථා සඳහා සිසුන් දිරිමත් කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස මෙහෙයවයි.

8 පන්ති කාමරයේ දී සිසුන්ගේ මතුවන අභියෝගාත්මක චර්යා ගැටලු අවස්ථානෝචිත පරිදි කළමනාකරණය කරයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සැසි සැලැස්ම

මොඩියුල අංක 03

| සැසිය | මාතෘකාව | අන්තර්ගතය | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|
| 01 | පන්තිකාමර කළමනාකරණය | 1.1 කළමනාකරණය යනු කුමක්ද ?<br>1.2 කළමනාකරණය පිළිබඳ නිර්වචන<br>1.3 කළමනාකරණ ක්‍රියාවලිය | මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැහැදිලි කිරීම හා ස්වයං අධ්‍යයනයට යොමු කිරීම | පැය 02 |
| | පන්තිකාමර කළමනාකරණය හා ගුරු භූමිකාව | 1.4 පන්ති කාමරය යනු කුමක්ද?<br>1.5 පන්ති කාමර කළමනාකරණය යනු කුමක්ද?<br>1.6 හොඳ පන්ති කාමරයක ලක්ෂණ<br>1.7 පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියේ අවශ්‍යතාවය<br>1.8 පන්තිකාමර කළමනාකරුවෙකු ලෙස ඔබ සතු කාර්යභාරය<br>1.9 පන්ති කාමර කළමනාකරණයේදී ගුරුවරයා අනුගමනය කළයුතු උපාය මාර්ග හා විශිෂ්ට ව්‍යවහාර<br>1.10 පන්තිකාමර කළමනාකරණයේදී භෞතික, සමාජ හා මනෝවිද්‍යාත්මක වාතාවරණය<br>1.11 පන්ති කාමර කලමකරණය සඳහා ගුරුවරයා සතු විය යුතු ගුණාංග<br>1.12 පන්ති කාමර කළමනාකරණයේදී මතුවන ගැටලු හා ඊට විසඳුම්<br>1.12.1 පන්ති කාමර කළමනාකරණය හා සම්බන්ධ ගැටලු<br>1.12.2 ගැටලු සඳහා විසදුම් | මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැහැදිලි කිරීම හා ස්වයං අධ්‍යයනයට යොමු කිරීම | පැය 05 |
| | 21 වන සියවසට ගැලපෙන පන්තිකාමරය | 1.13 21වන සියවසට ගැලපෙන පන්ති කාමරය හා ගුරු භූමිකාව | | |
| 02 | ශිෂ්‍යයා හඳුනා ගැනීම | 2.1 ශිෂ්‍යයා හඳුනා ගැනිම<br>2.2 ශිෂ්‍යයා හඳුනා ගැනීමට අදාළ මනෝවිද්‍යාත්මක න්‍යායයන්<br>2.3 ළමා සංවර්ධන අවධි අධ්‍යයනය<br>2.4 ශිෂ්‍යයා හඳුනා ගැනීමට භාවිතා කරන උපකරණ<br>2.5 ළමා සංවර්ධනයට ආරය හා පරිසරයේ බලපෑම<br>2.6 විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම | මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පැහැදිලි කිරීම හා ස්වයං අධ්‍යයනයට යොමු කිරීම | පැය 05 |
| 03 | සමාලෝචනය හා ඇගයීම | | මාර්ගගත ක්‍රමවේද ඔස්සේ අධ්‍යයනය කරන ලද කරුණු සමාලෝචනය කිරීම | පැය 02 |



Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Iscolee.blogspot

# 1 පන්ති කාමර කළමනාකරණය

පහත අනු මාතෘකා යටතේ අධ්‍යයනය කරන්න. ඔබගේ පන්ති කාමරය කෙසේ කළමනාකරණය කර ගත යුතු දැයි නිශ්චය කරන්න.

1.1 කළමනාකරණය යනු කුමක්ද ?

1.2 කළමනාකරණය පිළිබඳ නිර්වචන

1.3 කළමනාකරණ ක්‍රියාවලිය

1.4 පන්ති කාමරය යනු කුමක්ද?

1.5 පන්ති කාමර කළමනාකරණය යනු කුමක්ද?

1.6 හොඳ පන්ති කාමරයක ලක්ෂණ

1.7 පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියේ අවශ්‍යතාවය

1.8 පන්තිකාමර කළමනාකරුවෙකු ලෙස ඔබ සතු කාර්යභාරය

1.9 පන්ති කාමර කළමනාකරණයේදී ගුරුවරයා අනුගමනය කළයුතු උපාය මාර්ග හා විශිෂ්ට ව්‍යවහාර

1.10 පන්තිකාමර කළමනාකරණයේදී භෞතික, සමාජ හා මනෝවිද්‍යාත්මක වාතාවරණය

1.11 පන්ති කාමර කළමනාකරණය සඳහා ගුරුවරයා සතු විය යුතු ගුණාංග

1.12 පන්ති කාමර කළමනාකරණයේදී මතුවන ගැටලු හා ඊට විසඳුම්

1.12.1.1 පන්ති කාමර කළමනාකරණය හා සම්බන්ධ ගැටලු

1.12.1.2 පන්ති කාමර කළමනාකරණයේදී මතුවන ගැටලු සදහා විසඳුම්

1.13 21වන සියවසට ගැලපෙන පන්ති කාමරය හා ගුරු භූමිකාව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 1.1 කළමනාකරණය යනු කුමක්ද ?

කළ / මනා / කරණය

කළයුතු දේ මනාව කිරීමයි.
උපායශීලී ලෙස මිනිසුන් හසුරුවා ගැනීම හෙවත්
පාලනය කර ගැනීම කළමනාකරණයයි.

**Manage** → පාලනය හෙවත් හැසිරවීම.


**men** → මිනිසුන්.

**t** → උපායශීලීව. **(Tactful)**



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.2 කළමණාකරණය පිළිබඳ නිර්වචන



''කළමනාකරණය යනු; ආයතනයක අරමුණු ඉටු කරවා ගැනීමට ආයතනය; සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහයවීම හා පාලනයකිරීමේ ක්‍රියාවලියයි.''

ජේම්ස් ඒ. ස්ටෝනර් (James A Stoner)

''කළමනාකරණය යනු; කිසියම් සංවිධානයක,ආයතනයක නිශ්චිත අරමුණු ඉලක්ක සාර්ථකව ඉටුකර ගැනීම සඳහා එහි ක්‍රියාකාරීත්වයන් ඵලදායක ලෙසත් කාර්යක්ෂම ලෙසත් හැසිරවීමේ සමාජමය ක්‍රියාවලියයි.''

බ්රේක් (Breke)

''කළමනාකරණය යනු; මිනිසුන් ලවා වැඩ කරවා ගැනීමයි. නැතහොත් අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාවයි.''


මේරි පාකර් පොලොට් (Mary Parker Follet)




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.3 කළමනාකරණ ක්‍රියාවලිය.

කළමනාකරණ ක්‍රියාවලිය එකිනෙකට සම්බන්ධ කාර්යයන් සමූහයකින් සමන්විතයි.




| | | | |
|---|---|---|---|
| P | Planning | - | සැලසුම්කරණය |
| O | Organization | - | සංවිධානය |
| D | Directing | - | මෙහයවීම |
| C | Controlling | - | පාලනය |




ජේම්ස් ඒ. ස්ටෝනර් (**James A Stoner**)



Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

වර්තමානයේ බොහෝ කළමනාකරුවන් හා දාර්ශනිකයන් කළමනාකරණය කාර්යයන් හතරකට ගොනුකර ඇත.




මෙම මූලික කාර්යයන් අධ්‍යාපන ක්ෂේත්‍රයේදී පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියටද සම්බන්ධතාවයක් පෙන්වයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## කළමනාකරණ සංකල්පය පන්ති කළමනාකරණයට සම්බන්ධ වන ආකාරය

ඉගෙනුම් පරිසරයක් සකස් කිරීම, ඉගෙනුම් ද්‍රව්‍ය හා උපදෙස් සකස් කිරීම, කාලය කළමනාකරණය කිරීම ඇතුලු ඉගෙනීම හා ඉගැන්වීම සඳහා කරන සෑම දෙයක්ම පන්ති කාමර කළමනාකරණයට අයත් වේ. ඉගැන්වීමේ අරමුණු වඩා හොඳින් වර්ධනය කර ගැනීම සඳහා ඵලදායී ගුරුවරුන් පන්ති කාමර කළමනාකරුවන් ලෙස ක්‍රියා කළ යුතුය. සාර්ථක පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියක දී, සිසුන්ගේ අවශ්‍යතා පිළබඳ අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් වේ. පන්ති කාමර කළමනාකරණය සහයෝගී ප්‍රජාවක් (collaborative community) ප්‍රවර්ධනය කිරීම, සිසුන්ගේ හඬ (students voice) ඉස්මතු කිරීම, නිර්මාණශීලිත්වය (creativity), නායකත්වය (leadership), විවේචනාත්මක චින්තනය (critical thinking), සහ ඵලදායී කණ්ඩායම් ක්‍රියාකාරකම් (effective teamwork) සඳහා දිරිමත් කරයි.

**සැලසුම්කරණය**:-

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පසුබිම සැලසුම් විය යුතුය. එහි දී ඉගෙනුමට ගැලපෙන ලෙස පන්ති කාමර සැකැස්ම, ඉගෙනුම් අත්දැකීම්, ඉගෙනුම් සම්පත් සැලසුම් කිරීම යි. එය ඉගෙනුම් ක්‍රියාකාරකම් පිළිබඳ සංකල්ප සිතියමක් ද වෙයි.

ගුරුවරයා සකස් කරගන්නා පාඩම් සැලැස්ම, පාඩමට අදාළ දෘෂ්‍යාධාර හා උපකරණ සූදානම් කිරීම, මෙන්ම පන්ති කාමරය ඉගෙනුමට උචිත ලෙස පිරිසිදු කිරීමත් පන්ති සැලසුම් කිරීමේ අවස්ථා වේ. තව ද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඇතිවිය හැකි බාධා / අභියෝග පිළිබඳව ගුරුවරයා පූර්වයෙන් නිශ්චය කොට ඒවාට සාර්ථකව මුහුණ දීමට සැලසුම් කිරීමත් වැදගත් වේ.

**සංවිධානය** :-

පන්ති සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීම පන්ති සංවිධානයයි. ඉගෙනීමට සුදුසු වන පරිදි පන්ති වාතාවරණය සකස් කිරීම සංවිධානයේ මූලිකම පියවරයි. මෙහි දී සැලැස්මේ පරිදි අවශ්‍ය මානව , භෞතික සම්පත් සපයා ගෙන සූදානම් කර ගැනීම, හරි වැරදි පරික්ෂා කිරීම , පූර්වපන්තිකාමර සැකැස්ම Class room Arrangement)සූදානම් කිරීම පිළිබඳව සැලකිලිමත් වීම අදාළ වේ.

පන්ති කාමරය තුළ මෙන්ම අවට පරිසරය ද බාධා නොවන ලෙස පවත්වා ගැනීම සඳහා පන්ති කාමර සම්මුතීන් , නායකත්ව භූමිකා, පුද්ගල සහාය යොදා ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලක්/ ක්‍රියාපටිපාටියක් පවත්වා ගැනීම සංවිධානයේ දී වැදගත් ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**මෙහෙයවීම** :-

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා පූර්වයෙන් සංවිධානය කර ගත් භෞතික හා මානව සම්පත් ඵලදායීව යොදා ගැනීම පන්තිය මෙහෙයවීමයි. මෙහි ප්‍රධාන වගකීම පන්ති භාර ගුරුවරයා සතු වේ.

- පන්ති නායකයින්, විෂය නායකයින් මෙන්ම පන්තියට සම්බන්ධ වන ගුරුවරුන් ද, වෙනත් සම්පත්දායකයින් ද මේ සඳහා සම්බන්ධ කර ගැනීම.
- එහි දී පූර්වයෙන් නිශ්චය කරන ලද අභියෝග මෙන්ම අනපේක්ෂිත බාධා, ගැටලු සඳහා ද උපායශීලිව මුහුණ දීම
- ශිෂ්‍ය චර්යා කළමනාකරණය කිරීම
- අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීම
- ආරක්ෂාව තහවුරු කිරීම

**පාලනය** :-

- සිසු විනය පාලනය, නීති රීති පවත්වා ගෙන යාම
- සැලසුම් ගත කාර්ය ඉෂ්ට කර ගැනීම සඳහා කැපවීම
- ප්‍රතිපෝෂණ/ ඉදිරිපෝෂණ සැපයීම
- නියාමනය කිරීම
- ප්‍රත්‍යවේක්ෂණ ඉදිරිපත් කිරීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.4 පන්ති කාමරය යනු කුමක්ද?

- බාධාවකින් තොරව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවීම සඳහා පහසුකම් හා සහාය සපයන ආරක්ෂිත ස්ථානයකි.

- පන්ති කාමරය තුළ ඉගෙනුම හා ඉගැන්වීම වඩාත් ඵලදායී ලෙස සිදුවිය හැකි පරිසරයක් ගොඩනැංවීමටත්, එය පවත්වා ගෙනයාමටත් ඒ සඳහා අවශ්‍ය මානව, භෞතික හා කාල සම්පත කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමටත් අවශ්‍ය ක්‍රමෝපායන් භාවිතා කිරීමේ ක්‍රියාවලිය ලෙස හැඳින්වීමට පුළුවන.

  - ඔබේ පන්ති කාමරය මෙලෙස සකස්කරන්න සූදානම් වන්න.
  - Click

ඉගෙනුම ලැබිය හැකි ස්ථාන පාසලක හෝ අධ්‍යාපන ආයතනයක කාමරයකට පමණක් සීමා නොවන අතර ගුරුවරයා සිසුන් සමඟ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වා ගන්නා ස්ථානයක් හෝ අවස්ථාවක් වේ.

නූතන නිර්වචනයන්ට අනුව පන්ති කාමරය යනු ඉගෙනුම ලැබිය හැකි භෞතිකව හෝ නාමිකව නිර්මිත ඕනෑම තාත්වික හෝ අතාත්වික ස්ථානයකි.

පන්ති කාමරයක් ලෙස සැලකෙන ස්ථාන / අවස්ථා සඳහා නිදසුන් :

- පාසලක ස්ථාපිත නම්කරන ලද පන්ති කාමර
- විශේෂ ඉගෙනුම් ඒකක (සෞන්දර්ය ඒකක, විද්‍යාගාරය, ගණිතාගාරය, ......)
- එළිමහන් පන්ති කාමර ( පාසල් භූමිය, පරිශ්‍රය, තුරු සෙවන මේ සඳහා යොදා ගැනේ)
- ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කරන හා ඉගෙනුම් අත්දැකීම් ලබා ගන්නා ස්ථාන (ගොවි පොල, වෙළඳ පොල, ආගමික සිද්ධස්ථාන, රෝහල, කසළ බැහැර කරන ස්ථාන......)
- අතාත්වික / නාමික පන්ති කාමර / Virtual Classrooms (මාර්ගගත ඉගෙනුම්-ඉගැන්වීම් සිදුවන අවස්ථා, ස්වයං ඉගෙනුම් උපාංග.....)





Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.5 පන්ති කාමර කළමනාකරණය යනු කුමක්ද?

සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරයා විසින් උපරිම ඵලදායී හා කාර්යක්ෂමබවින් යුතුව පන්ති කාමර පරිසරය පවත්වාගෙන යාම පන්ති කාමර කළමනාකරණය සඳහා නිර්වචනයකි.

පන්ති කාමරය තමන්ට ඵලදායීව ඉගෙනුම් අත්දැකීම් ලැබිය හැකි ස්ථානයක් ලෙස සිසුන්ට දැනීමත්, එය සිසුන්ගේ ඉහළ අපේක්ෂා දිරි ගැන්වීම සඳහා යෝග්‍යවන ස්ථානයක් වීමත් පන්ති කළමනාකරණයේ වැදගත්ම ප්‍රතිඵලය වේ.

ගුරුවරයා උපදේශකයකු හෝ ඉගැන්වීමේ කාර්යයේ නියුතු පුද්ගලයෙකු පමණක් නොවේ. ඊට වඩා පුළුල් මෙහෙවරක් පන්ති කාමරය තුළ දීත් ඉන් පිටත දීත් ගුරුවරයාගෙන් සිදු විය යුතුය. එනම් ගුරුවරයා යනු පන්ති කාමර කළමනාකරුවෙකි. (ටර්නි.සී, 1992)


- ❖ හිතකර චර්යාවන් උපස්ථම්භනය කිරීමෙන්ද, අහිතකර චර්යාවන් නිරුත්ධනය කිරීමෙන් ද පන්ති කාමර පරිසරය සක්‍රිය ලෙස පාලනයට නතු කිරීමේ ක්‍රියාවලිය පන්තිකාමර කළමනාකරණයයි.

  (ගිබ්සන් 1981)

- ❖ ශිෂ්‍යයාට හා ගුරුවරයාට ප්‍රියජනක ස්ථානයක් ලෙසත් අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකි වන ලෙසත් පෙළඹවීමෙන් වැඩ කළ හැකි වතාවරණයක් ඇති තැනක් බවට පන්ති කාමරය පත්කර ගැනීමට ගන්නා උත්සාහයකි.

- ❖ පන්ති කාමර කළමනාකරණ යනු; සිසුන් සහිත පන්තියක් මනාව හසුරුවා ගෙන යාමයි. පන්ති කළමනාකරණය යන සංකල්පය පන්ති පාලනයට වඩාත් වෙනස් වූ පුළුල් කර්තව්‍යයකි. පාලනය යන්න කළමනාකරණයෙහි එක් කාර්යයක් පමණි. එහෙත් පන්ති කළමනාකරණයේදී සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම,පාලනය,සම්බන්ධීකරණය,ගෘහපාලනය, පෝෂණය යනාදී විවිධ කළමනාකරණ කටයුතු කිරීමට සිදුවේ.

(ජෝන්සන්,බෲක් 1997)




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


# 1.6 හොඳ පන්තිකාමර කළමනාකරණයක ලක්ෂණ

ඔබේ පන්ති කාමරය සිහිකරගන්න. ක්‍රියාත්මක දෑ හරියට කරන්න. අනෙකුත් දෑ එකතුවීම් කර ගැනීමට පසුබට නොවන්න.

- ✓ කාලාඥතාවය
- ✓ සුදානම
- ✓ කාර්යක්ෂමතාවය/කාර්යශීලීත්වය
- ✓ ශිෂ්‍යය සහභාගීත්වයට හා සහයෝගයට ඉඩ සැලැසීම
- ✓ ඵලදායී සන්නිවේදනය (පැහැදිලි කිරීම්,විස්තර කිරීම්,දේශන,හඬ පාලනය)
- ✓ අර්බුද අවස්ථාවන් දී පැහැදිලි ක්‍රමෝපායන් භාවිතය
- ✓ අපක්ෂපාතීත්වය
- ✓ සංසන්දනය කිරීම් වලින් වැළකීම
- ✓ අභ්‍යාස ලකුණුකිරීම
- ✓ ඉගෙනීමට අදාළ ශිෂ්‍යය ගැටලු විසඳීම
- ✓ සිසුන්ට ප්‍රශ්න ඇසීමේ ඉඩකඩ ලබා දීම
- ✓ ශිෂ්‍යයන් තුළ නායකත්ව හැකියාව සංවර්ධනය කිරීම
- ✓ සෑම පන්ති කාර්යයක්ම සැලසුම්කර සංවිධානය කර ක්‍රියාත්මක කිරීම
- ✓ ආදර්ශමත් භාවය
- ✓ මිත්‍රශීලී භාවය,මඟපෙන්වීම, උපදේශනය ආදී ලක්ෂණ වලින් යුක්ත වීම
- ✓ ගුරු-සිසු, සිසු-සිසු අන්තර් ක්‍රියාවන්ට ඉඩකඩ සැකසීම
- ✓ පන්තිකාමරය තුළ ඉගෙනුම් වාතාවරණයක් ඇතිකිරීම (චාට්/ප්‍රස්තාර/ආදර්ශ පාඨ/පාඩම් හා සම්බන්ධ රූපසටහන් ආදිය)
- ✓ ශිෂ්‍යයා නිර්මාපීභාවය ඉස්මතු කර ගැනීමට අවස්ථා සැලසීම
- ✓ පාසල් නීතිරීති,ප්‍රමාණ හා අගයයන් ආදිය පන්ති කාමර පරිසරය තුළ ද ආරක්ෂා වීම
- ✓ යහපත් විනයක් පැවතීම
- ✓ පන්තිය පිළිබඳ තියුණු සැලකිල්ලකින් සිටීම
- ✓ පන්තියේ සිදුවන දේ විශ්ලේෂණය කිරීම
- ✓ විශ්වාසය ගොඩනංවා ගැනීම/පොරොන්දු ඉටුකිරීම
- ✓ සෑම ශිෂ්‍යයයෙකුම පිළිබඳව නිවැරදි හා ගැඹුරු හඳුනා ගැනීමක් තිබීම
- ✓ ශිෂ්‍යයන්ගේ පෞද්ගලික ගැටලු පිළිබඳව සලකා බැලීම

# 1.7 පන්තිකාමර කළමනාකරණ ක්‍රියාවලියේ අවශ්‍යතාවය



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.8 පන්තිකාමර කළමනාකරුවෙකු ලෙස, ඔබසතු කාර්යභාරය

- පන්ති කාමරයේ සැකැස්ම පිළිබඳ සාකච්ඡා කර තීරණ ගන්න.
- දෛනික වැඩසටහන් වල කරනු ලබන වෙනස්කම් පිළිබඳව උදයේම සාකච්ඡා කරන්න.
- ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් දෙන්න.
- පෙලඹවීම්- කාර්යයන් සිදුකරන්න.
- පෞද්ගලික අවශ්‍යතා පිළිබඳව අවධානය යොමුකරන්න.
- පාසල් තොරතුරු හා අනෙකුත් වැදගත් දේ නිවැරදි ක්‍රම භාවිතයෙන් සන්නිවේදනය කරන්න.
- පවරන ලද කාර්යයන් දෛනික කටයුතු පිළිබඳ සොයා බලන්න.
- අදාළ නීතිරීති පද්ධති නිරන්තරව සිහිපත් කරන්න. (ශිෂ්‍ය විනය, යහපැවැත්ම පිළිබඳව)
- ශිෂ්‍ය චර්යා කළමනාකරණයට අදාළ කටයුතු ක්‍රියාත්මක කරන්න.
- එකමුතුකම, සහභාගීත්වය දියුණු කිරීම සඳහා කාර්යයන් පවරන්න.
- පන්තිකාමර තුළ අන්තර් සබඳතා සංවර්ධනය වීමට ඉඩ කඩ සලස්වන්න.
- පන්ති කාමරය තුළ ඇති අවිධිමත් කණ්ඩායම්, නිරුන්ධන කිරීම් හා අවමකරණය සඳහා පිළියම් යොදන්න.
- ශිෂ්‍ය ගැටලු විසඳීමට - උපදේශන සේවා කටයුතු සිදු කරන්න.
- අදාළ ලිපිලේඛන ක්‍රමවත්ව පවත්වාගෙන යන්න.
- ශිෂ්‍යයා මැනවින් හඳුනාගන්න.
- යහපත් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වන්න.
- පන්ති කාමරයේ භෞතික හා සමාජ මනෝ විද්‍යාත්මක වාතාවරණය පිළිබඳව සිතා බලා කටයුතු කිරීම
- විෂය සමගාමී කටයුතු සිදු කරන්න.
- ප්‍රජා සම්බන්ධතා කටයුතුවල නියැලෙන්න



# 1.9 පන්ති කාමර කළමනාකරණයේදී ගුරුවරයා අනුගමනය කළයුතු උපාය මාර්ග හා විශිෂ්ට ව්‍යවහාර

- ආදර්ශමත් හැසිරීම (සිසුන්ගෙන් දැකීමට අවශ්‍ය හැසිරීම නිරූපණය කිරීමේ පුරුද්දක් ඇති කර ගැනීම)
- ප්‍රශස්ත අධ්‍යාපන ක්‍රියාවලියකට උදව් කිරීමට සියලු සිසුන් එකඟ කර ගැනීම හා ධනාත්මක චර්යා දිරිමත් කිරීම
- පන්ති කාමර නීති රීති ගොඩනඟා ගැනීමට, පන්ති කාමර නීති රීති හා සම්මුතීන් නොකඩා පවත්වා ගැනීමට කටයුතු කිරීම
- සිසු අදහස් ලබා ගැනීම හා ඒවා සැලකිල්ලට ගනිමින් පන්ති සැකැස්ම සිදු කිරීම
- අධ්‍යාපනය සඳහා සිසුන් දිරිමත් කිරීම, ප්‍රශංසා කිරීම
- සිසුන්ට ඉදිරිපත් වීම සඳහා අවස්ථා සළසා දීම
- පන්ති කාමරය තුළ මතුවන ගැටලු එය තුළදීම විසඳා ගැනීමේ සංස්කෘතියක් පැවතීම
- කායිකව දඬුවම් කිරීම වෙනුවට වැරැද්ද නැවත නොකිරීම සඳහා සිසු මනස සකස් කිරීම
- සිසුන් සමඟ කටයුතු කිරීමේ දී අවස්ථානුකූලව මිත්‍රශීලී, නම්‍යශීලී හා සෘජු පිළිවෙත් නිරූපනය කිරීම
- විවිධ කාර්යයන්හි නායකත්ව හා වගකීම් සිසුන්ට පැවරීම හා ඒවා නියාමනය කිරීම
- වාචික හා අවාචික සන්නිවේදනය ඵලදායීව භාවිත කිරීම
- සිසුන්ට ආකර්ෂණීය වන පරිදි පාඩම් සඳහා දෘෂ්‍යාධාර සකස් කර භාවිත කිරීම
- සිසුන්ගේ ඉගෙනුම් කාර්යයන් නියාමනය කිරීම හා සිසු ගැටලු සඳහා ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීම
- පාඩම් ප්‍රවේශය, පාඩම් අන්තර්ගතය ඉගැන්වීම් දී සිසු උද්දීපනය වැඩි වන අයුරින් ඉගෙනුම් ක්‍රම හා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ විවිධ ව්‍යාපෘති සඳහා අවස්ථා සැලසීම
- සිසුන් තුළ පාසල, ගුරුවරුන් හා ඉගැනුම පිළිබඳව විශ්වාසය ඇති කරවීමට කටයුතු කිරීම
- පන්ති කාමර යහපත් ව්‍යවහාර සංස්කෘතියක් ඇති කිරීම

# 1.10 පන්ති කාමර කළමනාකරණයේදී භෞතික, සමාජ හා මනෝවිද්‍යාත්මක වාතාවරණය

- මතුවන ගැටලු විසඳීම හා අභියෝග අභිබවා යාම සඳහා ඉදිරිපත් වීම
- පැහැදිලි, නිවැරදි හා ඵලදායී සන්නිවේදනය පවත්වා ගැනීම
- ලිපි ලේඛන විධිමත්ව පවත්වා ගැනීම
- ශිෂ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම
- සිසු විනය පවත්වා ගැනීමට අදාළ නීති රීති, සම්මුතීන් ඇති කිරීම හා යහපත් සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම
- භෞතික සම්පත් ආරක්ෂිතව හා ඵලදායීව භාවිත කිරීම
- පන්ති කාමරයේ පිරිසිදු බව,ප්‍රසන්න බව හා ආකර්ෂණීය බව පවත්වා ගැනීම
- පන්ති කාමර ඉගෙනුම් පරිසරය විධිමත්ව පවත්වාගෙන යාම
- ශිෂ්‍යයා හඳුනා ගැනීම
- ප්‍රතිකාරය/ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ක්‍රියාත්මක කිරීම
- ඉගෙනුම් ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම
- සිසු චර්යා සංවර්ධනය කිරීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඔබ නිර්මාණශීලී වූ තරමටම ගුරු තරුවක් ලෙසින් ඔබ බබළාවි.**

| භෞතික වතාවරණය | සමාජ මනෝවිද්‍යාත්මක වාතාවරණය |
|---|---|
| පවිත්‍රතාවය | ගුරු-සිසු අන්තර් සබඳතා |
| ලිපි ලේඛන<br>-ශිෂ්‍යය වැඩ පොත<br>-නාම ලේඛනය<br>-පන්ති වාර්තා පොත<br>-සෞඛ්‍ය වාර්තා | ශිෂ්‍යයා හඳුනා ගැනීම<br>-සාධන හැකියා<br>-සාධන මට්ටම්<br>-සමාජ ආර්ථික පසුබිම<br>-පවුල් පසුබිම<br>-සෞඛ්‍යය<br>-විභවයතා |
| පන්ති නාම පුවරුව | සම්ප්‍රදායන්,ප්‍රතිමාණ,නීති රීති ආදිය |
| ගුරු මේසය | දෛනික අනිවාර්ය කටයුතු |
| සිසු මේස, සංවිධානය | පන්ති කාල සටහන් පිළිබඳ දැනුවත් බව<br>-නිදහස් කාලච්ඡේද වල පැවරුම්<br>-පැවරුම් බැංකුව<br>-ප්‍රශ්න බැංකුව<br>-නිබන්ධන |
| අනුමත ශිෂ්‍ය ඉඩ ප්‍රමාණය | පෙලඹවීම<br>-ඉගෙනුම්<br>-විනය සඳහා |
| අනිකුත් ලී බඩු | ස්වයං අධ්‍යාපන හා විනය |
| කළු ලෑල්ල white Board, Green Board | ශිෂ්‍යය ගැටලු පිළිබඳව පොදු සාකච්ඡා |
| චාර්ට්ස් ආදී, ප්‍රදර්ශන ඉගෙනුම් පුවරු | ශිෂ්‍යය පෞද්ගලික ගැටලු පිළිබඳ අවධානය |
| ආගමික දෑ | ශිෂ්‍යය ප්‍රගතිය පිළිබඳව නිරන්තර සාකච්ඡා |
| ශිෂ්‍යය උපකරණ, ආම්පන්න තැබිය හැකි ස්ථානයක් | ශිෂ්‍යය පන්ති කව පැවැත්වීම දෙමාපියන් ආශ්‍රිතව |
| යෝග්‍ය වාතාශ්‍රය | ශිෂ්‍යය සහභාගීත්වය, නායකත්වය ඇති වන පරිදි අවස්ථා සැකසීම |
| බාධක වලින් තොරවීම<br>-අභ්‍යන්තර/බාහිර | ශිෂ්‍යයන්ගේ ස්වයං තෘප්තිය සතුට පිළිබඳ සැලකිල්ල<br>(Child Friendly) |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.11 පන්ති කාමර කළමනාකරණය සඳහා ගුරුවරයා සතු විය යුතු ගුණාංග

- ස්වයං සවිඥානිකබව, සිහිය හා දැනීම(Self Consciousness)
- නම්‍යශීලිබව සහ සමතුලිතබව
- විනයගරුක බව
- සමථකරණ හැකියාව (Troubleshooting Ability)
- සංස්කෘතියට සංවේදී වීම(Cultural Sensitivity)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.12 පන්ති කාමර කළමනාකරණයේදී මතුවන ගැටලු හා ඊට විසඳුම්

## 1.12.1 පන්ති කාමර කළමනාකරණයේදී මතුවන ගැටලු


ඔබ මුහුණ දෙන
පන්ති කාමර කළමනාකරණය
හා
සම්බන්ධ ගැටලු.

**සම්පත් හිඟය පිළිබඳ ගැටලු**
(ඉඩකඩ මදි වීම, ඉගෙනුම් උපකරණ සාම්ප්‍රදායිකවීම,
නව සම්පත් භාවිතයට පුහුණු ශ්‍රමය නැති වීම)

**සිසුන් සම්බන්ධ ගැටලු**
(පාසල් නොපැමිණීම, ශිෂ්‍ය සාධන දුබලතා,
අහිතකර නිවෙස් පරිසරය,
දෙමාපිය සහය නැතිකම, දුර්ද්‍රතාවය
විනය ගැටලු)

**දෙමාපිය සහාය සම්බන්ධ ගැටලු**
(නූගත් බව,කාර්ය බහුල බව,
පාසල සම්බන්ධ නොසැලකිලිමත් ආකල්ප,
වගකීම් යුතුකම් පාසැලටම පැවරීම)

**පරිපාලනමය ගැටලු**
(පන්තියක ශිෂ්‍ය ප්‍රමාණය වැඩි වීම,
බාහිර වැඩ නිසා ඉගෙනුම් කාලය අඩු වීම,
ඉගෙනුම් උපකරණ ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි නොලැබීම,
ගුරු නොපැමිණීම,
සහන කාල සටහන් ක්‍රියාත්මක නොවීම)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.12.2 ගැටලු සඳහා විසඳුම්

ඔබගේ වගකීම් සහිත නායකත්වය විසින් සියල්ල කළමනාකරණය කරගනු ලැබේ.






ඔබ දැන් හොඳ පන්ති කාමර කළමනාකරුවෙක්...

Click

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 1.13 21 වන සියවසට ගැලපෙන පන්ති කාමරය හා ගුරු භූමිකාව

- පන්ති කාමරය ඉගෙනුම් ඵල සාක්ෂාත් කර ගැනීමට උචිත පරිදි සකස් කිරීම
- සිසුන්ට ස්වාධීනව කටයුතු කරමින් ඵලදායී අධ්‍යාපනයක් ලැබීමට සහාය වීම හා ඊට දිරිමත් කිරීම
- යහපත් හර පද්ධතීන් / ආචාරධර්ම ප්‍රවර්ධනය කිරීම හා ආදර්ශ සැපයීම
- දැනුම, කුසලතා හුවමාරු කිරීමට හැකිවන පරිදි සිසුන්ට අවස්ථා සළසා දීම
- සිසුන් හා ගුරුවරුන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීම
- බාහිර ප්‍රජාවගේ සහාය ලබා ගැනීම
- සිසු විවිධත්වය, විවිධ හැකියා හා ලැදියා, අත්දැකීම් සහ ආකල්ප ශක්තීන් ලෙස භාවිත කිරීම
- නව තාක්ෂණික උපාංග භාවිත කිරීම
- තාක්ෂණයේ වෙනස්කම්වලට සංවේදී වීම

**සාම්ප්‍රදායික පන්ති කාමරය හා 21 වන සියවස සඳහා පන්ති කාමරය**

| සාම්ප්‍රදායික පන්ති කාමරය | | 21 වන සියවස සඳහා පන්ති කාමරය | |
|---|---|---|---|
| ගුරු කේන්ද්‍රීය | සෘජුවම උපදෙස් හා තොරතුරු ලබා දෙයි.<br><br>සිසුන් වෙත තොරතුරු සම්ප්‍රේෂණය හා සිසුන්ගේ දැනුම ආවර්ජනය කිරීම සඳහා අවධානය යොමු වේ | ශිෂ්‍ය කේන්ද්‍රීය | සිසුන් තම අත්දැකීම් ලබා ගනිමින් (Authentic) ඉගෙනුම් සඳහා සුසාධ්‍යකරණය කරමින් මඟ පෙන්වයි. සිසුන්ට කළ හැකි දේ හා සිසුන් දන්නා දේ පිළිබඳ අවධානය යොමු වේ |
| විෂය අන්තර්ගතය ආවරණය කිරීම | සිසුන්ගේ ඉගෙනීම පිළිබඳව තක්සේරුකර ගැනීමකින් තොරව සියළු ඉගෙනුම් ද්‍රව්‍ය අදාල හා උපකාරක මෙන්ම උපදෙස් ද ගුරුවරයා විසින් ලබා දෙමින් විෂය අන්තර්ගතය ආවරණය කරයි. | ක්‍රියාකාරකම් සිදු කරමින් ඉගෙනීම. | අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්පත් කර ගතහැකි පරිදි විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කරයි. නිපුණතා වලට අදාල සිසුන්ගේ ප්‍රවීණතාවයේ ඌණතාවය මත නිපුණතාවයට ළඟා කිරීම සඳහා මැදිහත් කරුවකු ලෙස කටයුතු කරයි. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


| | | | |
|---|---|---|---|
| තොරතුරු ආවර්ජනය කිරීම | ඇගයීම හා තක්සේරුකරණයේදී දැනුම ආවර්ජනය කිරීමේ හැකියාව පරීක්ෂාවට ලක් කරයි. | තොරතුරු භාවිතා කරයි | ලබා ගත් දැනුම ප්‍රායෝගිකව භාවිතා කර පරීක්ෂාවට ලක් කරයි. |
| දේශකයෙක් ලෙස කටයුතු කරයි | ගුරුවරයා සතු දැනුම බෙදා හරියි. ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සඳහා ඇති අවස්ථා හා පහසුකම් සීමිත වේ. | සුසාධ්‍යකරුවකු ලෙස කටයුතු කරයි. ඉගෙනුම ලබන්නා කේන්ද්‍ර වන අතර ගුරුවරයා සුසාධ්‍යකරුවෙකි. | සිසුන්ට ගවේශණය සඳහා අවස්ථාව සලසමින් දැනුම සොයා ගැනීමට යොමු කරයි. අවශ්‍ය අවස්ථා වලදී සහාය වෙයි. |
| සමස්තයට ආමන්ත්‍රණය කරයි | සිසුන් සියළු දෙනාටම පොදුවේ සමාන උපදෙස් ලබා දෙයි. | එක් එක් සිසුවාගේ අවශ්‍යතා පිළිබඳව නම්‍යශීලීව වෙමින් කටයුතු කරයි | අවශ්‍යතා මත පදනම්ව සිසුන් කණ්ඩායම් කරයි. අවශ්‍යතා අනුව එක් එක් සිසුන්ගෙන් කණ්ඩායම් සඳහා සුදුසු පරිදි මඟ පෙන්වීම් සිදු කරයි. |
| මතකය හා අවර්ජනය | හැකියා තක්සේරුකරණයේ මූලික ක්‍රමවේදය පරීක්ෂණ (Test) වන අතර පහළ මට්ටමේ චින්තන හැකියාවන් මැන බලයි. | ඉහළ මට්ටමේ සමස්ත කුශලතා | ඉහළ මට්ටමේ චින්තන හැකියා මැන බැලීමේ ක්‍රමවේදය භාවිතා කරයි.( සංස්ලේෂණය, විශ්ලේෂණය, භාවිතය ඇගයීම) |
| තාක්ෂණය සුඛෝපභෝගී මෙවලමක් ලෙස සලකයි | මූලික වශයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් වශයෙන් පමණක් තාක්ෂණය භාවිතා කරයි | පූර්ණ වශයෙන් තාක්ෂණය පන්ති කාමරය හා සමඟ සම්බන්ධ කරයි. | තාක්ෂණය විවිධ කාර්යයන් සඳහා භාවිතා කරයි. (තොරතුරු ගවේශණය, අන්තර් සම්බන්ධතා පවත්වා ගැනීම, පැවරුම් සකස් කිරීම සහ ඉදිරිපත් කරයි |
| ඒකාකාරී ඉගෙනුම් ශෛලියක් භාවිතා කරයි | සෑම අවස්ථාවකම ගුරුවරයා දේශන ශෛලිය භාවිතා කරයි. සටහන් ලබා දීමට පෙළඹෙයි. සිසුන් එකම ආකාරයකට ඉගෙනුම් ලබා ගනී යැයි අපේක්ෂා කරයි. ලිඛිත මාධ්‍යයට පමණක් සිසුන්ගේ ප්‍රතිචාර බලාපොරොත්තු වේ. | සියළු සිසුන්ගේ ඉගෙනුම් ශෛලිය පිළිබඳ ප්‍රතිචාර දක්වයි. | තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා විවිධ ක්‍රමවේද භාවිතයට අවස්තාව ලබා දෙයි. සිසු පැවරුම්, ව්‍යාපෘති ආදිය විවිධ ක්‍රම ඔස්සේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ඇත.( ලිඛිත වාචික නාමය සංගීතමය අනුසාරයෙනි.....) |
| ඉගෙනුම් සම්භාරය | විෂය අන්තර්ගතය කෙරෙහි පමණක් අවධානය යොමු කරයි. | ඉගෙනුම් සඳහා පොළඹවයි. | ප්‍රශ්න ඇසීමට නිවැරදි ගවේශණයක් සිදු කිරීමට පිළිතුරු ලබා ගැනීමට සහ ජීවනය තුළින් අඛණ්ඩව ඉගෙනීමට සිසුන් යොමු කරයි. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | | | |
|---|---|---|---|
| විෂය මාලාවේ තිරස් හා සිරස් සම්බන්ධතාවය නොසැලකීම. | අනෙකුත් පන්ති කාමර හෝ විෂයන් සමඟ සම්බන්ධතාවයක් නොමැතිව හුදකලාව කටයුතු කරයි. | අන්තර් ක්‍රියාකාරී හැසිරීම | අනෙකුත් විෂයන් හා ශ්‍රේණි අතර සම්බන්ධතාවය පිළිබඳ සැලකිලිමත් වෙමින් සුදුසු ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දෙමින් කටයුතු කරයි. |
| හුදකලාව කටයුතු කරයි | සිසුන් හුදකලාව කටයුතු කිරීමට පොළඹවයි. | සාමූහිකව කටයුතු කරයි. | පන්තියේ අනෙකුත් සිසුන් සමඟ මෙන්ම සිසුන් අවට ලෝකය සමඟ සහයෝගීව කටයුතු කිරීමට පොළඹවයි. |
| විභාග මූලික ඇගයීම | විභාග මඟින් පමණක් සිසුන් ඇගයීමට ලක් කරයි. | කාර්යසාධනය මත පදනම් වූ ඇගයීම | ශිෂ්‍යයින්ගේ අවශ්‍යතා, කුසලතා, හා සාධන මට්ටම් පිළිබඳව අවධානය යොමු කරමින් විවිධ ක්‍රියාකාරකම් හා පැවරුම් මඟින් ඇගයීම සිදු කරයි. |
| පෙළ පොත් මුද්‍රිත මාධ්‍ය ආශ්‍රිතව වැඩි වශයෙන් ඉගැන්වීම සිදු වේ | ප්‍රධාන මූලාශ්‍ර ලෙස පෙළපොත මත පමණක් යැපෙයි | තාක්ෂණය ඇතුළු බහුවිධ මූලාශ්‍ර භාවිතා කරයි. | අන්තර්ජාලය විශේෂඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා සඟරා වැනි විවිධ මූලාශ්‍ර භාවිතා කරන අතර පෙළපොතද එවැනි එක් මූලාශ්‍රයක් ලෙස පමණක් භාවිතා කරයි. |
| ස්ව ඉගෙනුමට ඇති නිදහස සීමිතය | | ඉගෙනුම සඳහා ඇති නිදහස අසීමිතය | සිසුන්ට සැබෑ ජීවන අද්දැකීම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවයි. |
| සීමිත ඉඩකඩක් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවේ | | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තාත්වික මෙන්ම අතාත්වික පරිසරය ද භාවිත වේ. ඉගෙනුමට ඇති ඉඩකඩ අසීමිත වේ. ඒ සඳහා පන්ති කාමරය විවෘත ස්ථානයකි. | . |
| නිශ්චිත එකම පිළිතුරක් අපේක්ෂා කරයි. | එකම ආකාරයේ ප්‍රශ්න අසමින් පෙර නිශ්චය කරවන ලද සෑම විටම බලාපොරොත්තු වේ. ස්ව ඉගෙනුමට ඇති නිදහස සීමිතය. | සිසුන්ගේ විවිධ වෙනත් පිළිතුරු අපේක්ෂා කරයි. | විවිධ ආකාරයෙන් ප්‍රශ්න අසමින් ඉහළ මට්ටමේ චින්තන හැකියා වර්ධනය කරයි. බහුවිධ පිළිතුරු පිළිගනියි. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | | | |
|---|---|---|---|
| සිසුන්ගේ ප්‍රතිඵල පදනම් කර ගනිමින් ගුරුවරයා ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදෙයි. | ප්‍රගතිය වාර්තා කිරීමේ අරමුණින් පමණක් සිසු ඇගයීම් ලකුණු ගුරුවරයා විසින් විශ්ලේෂණයේ යෙදෙයි. | සිසුන් ගුරුවරුන්ද සමඟ තම ප්‍රතිඵල පිළිබඳ ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදෙයි. | සිසු ප්‍රබලතා , දක්ෂතා, දුබලතා හඳුනා ගැනීමට සහ අවශ්‍ය සහාය හා උපදෙස් ලබා දීමේ අරමුණින් ගුරුවරයා සිසුන් සමඟ ඇගයීම් ලකුණු විශ්ලේෂණය කරයි. |




*Critical Thinking
විචාරාත්මක විස්තරය
Creative and Innovation literacy
නිර්මාණාත්මක හැකියාව හා සාක්ෂරතාව
Collaboration
සහයෝගීතාවය
Communication
සන්නිවේදනය

- Information - තොරතුරු
- Literacy - සාක්ෂරතාවය
- Media Literacy - මාධ්‍ය
- Technology Literacy තාක්ෂණ සාක්ෂරතාව

- Flexibility and Adoptability නම්‍යශීලී බව හා අනුවර්තන හැකියාව
- Leadership and Responsibility
- නායකත්වය හා වගකීම
- Initiative and Self-Direction - ආරම්භක කුසලතා හා ස්වයං මෙහෙයවීම
- Social and Cross-Cultural Interaction සමාජ හා අන්තර් සංස්කෘතික සම්බන්ධතා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

### අමතර ක්‍රියාකාරකම්

- ඔබේ එදිනෙදා පන්ති කාමර කටයුතු වලදී අත්දකින අභියෝගාත්මක ගැටලු පාදක කර ගනිමින් ප්‍රත්‍යාවේක්ෂණ ජර්නලයක් ලිවීමට පුරුදුවන්න. මෙය සතියට දින 2වත් ලිවීමට යොමුවන්න.
- ඔබේ පන්තියේ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනාගන්න.
- නිරන්තර නිරීක්ෂණයෙන් හෝ වෙනත් ක්‍රමවේද භාවිතයෙන් ඔබ හඳුනාගත් ලක්ෂණයේ ස්වභාවය තහවුරු කරගන්න.
- ඔබගේ ප්‍රත්‍යාවේක්ෂණ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කළමනාකරණය කර ගැනීමට භාවිතා කරන්න.
- ඔබගේ වැදගත් අනාවරණයන් මිතුරු කණ්ඩායම් සමග හුවමාරු කරගන්න.

### පළමුවන සිද්ධිය

3 ශ්‍රේණියේ සිසුනට හැඩතල හඳුනා ගැනීමේ පාඩමක් ඉගැන්වීමට ගුරුවරියකට අවශ්‍ය විය. මේ සඳහා ඇය විවිධ හැඩ තල කට්ටල කිහිපයක් ගෙනවිත් තිබුණි. සමහර ඒවා ඝණ කඩදාසි වලින් සකසා තිබුණි. මේ සියල්ල පන්තියට ගෙන ගොස් මේසය මත තබා පාඩම ආරම්භ කළාය. එක් එක් හැඩය පෙන්වමින් හැඩ හඳුන්වා දුන්නා ය. මේ අතරතුර සිසුන් දෙදෙනෙක් නැගිට මේසය ළඟට පැමිණ හැඩතල දෙස ආශාවෙන් බලා සිට කිහිපයක් අතට ගත් හ. අසලම කණ්ඩායම පැමිණ කිහිපයක් රැගෙන ගොස් වාඩි විය. තවත් කිහිප දෙනෙක් නැගිට මේසය වටා රොක් වූහ. පන්තිය කලබලකාරී විය. අසල්වැසි පන්ති ගුරුවරිය ද දොර ළඟට විත් බාධාකාරී බව ඇඟෙව්වා ය. එවිට ගුරුවරිය නිශ්ශබ්ද ව වාඩි වෙන්න යයි සිසුන්ට අන දුන්නාය. මේ අතර සීනුව නාදවිය.

### දෙවන සිද්ධිය

"පද්මා" නැමැති ගුරුවරිය පන්තියට පැමිණියා ය. ළමෝ නැගිට "සුභ උදෑසනක් වේවා" යයි ප්‍රාර්ථනා කළ හ. ඇයත් පෙරළා ඔවුන්ට සුභ පැතුවා ය.

භාෂා ප්‍රහේලිකා සම්බන්ධ තරඟයක් පැවැත්වීම එදිනට නියමිත ව තිබිණි. පන්තිය වර්ණ දෙකක් අනුව කාණ්ඩ දෙකකට බෙදන ලදී. එක් එක් කණ්ඩායමට නමක් දී එකිනෙකාට මුහුණලා අසුන් ගැනීමට සලස්වන ලදී. ඉන් පසු ගුරුවරිය පහත දැක්වෙන උපදෙස් ලබා දුන්නා ය.

"මම සෑම කෙනෙකුට ම ප්‍රශ්නයක් ලියා ඇති කාඩ්පත බැගින් දෙනවා. එක් කෙනෙකු අනිත් කණ්ඩායමේ සාමාජිකයෙකුට ප්‍රශ්නයක් ඉදිරිපත් කළ යුතු යි. සෑම නිවැරදි උත්තරයකට ම ලකුණු 10ක් ලැබෙනවා."

සෑම කෙනෙකුට ම ප්‍රශ්න ඇසීමට හා උත්තර දීමට අවස්ථාව දෙන ලදී. අවසානයේ දී ගුරුවරිය ලකුණු එකතු කොට ජයග්‍රාහක කණ්ඩායමට තිළිණයක් ප්‍රධානය කළා ය. ඒ සමඟ ම පිළිතුරු දීමට අපහසු වූ තැන් ද පැහැදිලි කර දෙන ලදී.

### ක්‍රියාකාරකම - 1

පහත දැක්වෙන්නේ ප්‍රිය ජනක ඉගෙනුමකට බාධාකාරී යයි ගුරුවරයාට සිතෙන පන්ති වාතාවරණ කීපයකි. එය හෝ එය හා සමාන ඔබ අත් දැක ඇති පන්ති කාමර වාතාවරණයක් මෙහෙහි කර එහි ලක්ෂණ විස්තර කරන්න.

එය ප්‍රිය ජනක / යහපත් තත්වයකට ගෙන ඒම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගය සාකච්ඡා කර ක්‍රියාවලිය අනුපිළිවෙලින් ලියා දක්වන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

කණ්ඩායම් වාර්තාව ඉදිරිපත් කරන්න.

**1 කණ්ඩායම**

8 ශ්‍රේණියේ සිසුන්ගෙන් කොටසක් ගණිතය විෂය සඳහා අඩු සාධන මට්ටමක් පෙන්වයි.

**2 කණ්ඩායම**

5 ශ්‍රේණිය සිසුන් 30 ක් සිටින පන්ති කාමරයකි. පන්තියේ ඩෙස්පුටු 40 ක් පමණ ඇත. එක් කොණක දෘෂ්‍යාධාර රාශියක් අවිධිමත් ව තබා ඇත. අවශ්‍ය සම්පත් ඇති බවක් පෙනුනත් ඉඩකඩ ඇසුරුණු බවක් ඇත. පන්ති භාර ගුරුතුමිය පවසනුයේ මෙම පන්තියේ ළමයින් ඉගෙනීමට කම්මැලි බව ය.

**3 කණ්ඩායම**

10 ශ්‍රේණියේ ගණිත පාඩම් අවසානයේ දෙනු ලබන අභ්‍යාස ඉක්මනින් නිවැරදි ව නිම කරන සිසුන් කීප දෙනෙක් වේ. ඔවුහු වැඩ නිම කර ගුරුතුමියට පෙන්වා අන් අය සමග කථා කරති. කඩදාසි කොළ පාස් කර ගනිති. අනෙක් අයට උසුළු විසිළු කරමින්, ගුරුතුමිය අභ්‍යාස පොත් බලන අතර තුර එහා මෙහා ඇවිදිති. මොවුන් අනෙක් සිසුන්ට බාධාකාරී ලෙස ගුරුතුමියට හැඟේ.

**4 කණ්ඩායම**

10 ශ්‍රේණියේ සාහිත්‍ය පාඩම උගන්වන ගුරුවරියට දෙපස පන්තිවල ඝෝෂාකාරී බව බහුල ව අත්විඳීමට සිදුවේ.

**ක්‍රියාකාරකම- 2**

පියවර 1 : සහභාගීවන්නන් කණ්ඩායම් 4 කට බෙදා පහත සඳහන් ඒවායින් ශීර්ෂ දෙක බැගින් වෙන් කර දෙන්න.

1. පන්ති කාමර කළමනාකරණයට අදාල ලිපි ලේඛන පවත්වා ගෙන යාම.
2. ශිෂ්‍යයා හඳුනා ගැනීම.
3. පන්ති කාමර විනය පවත්වා ගැනීම
4. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය
5. භෞතික හා මානව සම්පත්
6. උපකාරක ඉගැන්වීම්
7. විෂය සමගාමී කටයුතු
8. ප්‍රජා සම්බන්ධතා අන්‍යෝන්‍යකරණය

පියවර 2 : එක් එක් කණ්ඩායමට දෙන ලද ශීර්ෂ යටතේ ගුරුවරයාගේ කළමනාකරණ කාර්යභාරයන් ලැයිස්තුගත කිරීමට යොමු කරන්න. අත්දැකීම් උදාහරණ ලෙස ගැනීමට යොමු කරන්න.

පියවර 3 : කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කරවීම. (ඉදිරිපත් කිරීම සඳහා විවිධ ක්‍රම භාවිතයට යොමු කරන්න.)

පියවර 4 : සමාලෝචනයක යෙදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## පැවරුම්

- මාර්ගගත ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදි හෝ ඔබේ එදිනෙදා පන්ති කාමර කටයුතු වලදී හෝ අත්දකින අභියෝගාත්මක ගැටලු පාදක කර ගනිමින් ප්‍රත්‍යාවේෂණ ජර්නලයක ලියන්න.

හෝ

- ඔබේ පන්තියේ සිටින විශේෂ අවශ්‍යතා ඇති සිසුවෙක් නිරීක්ෂණය කොට ප්‍රත්‍යෙක අධ්‍යයනයක යෙදෙන්න. (වචන 750ක් පමණ සෑහේ )

හෝ

- "21වන සියවසට අයත් සිසුවාට ගැලපෙන අධ්‍යාපනය" යන්නෙන් පුවත් පතකට සුදුසු ලිපියක් ලියන්න. (වචන 750ක් පමණ සෑහේ )

හෝ

- ඔබ මනා කළමනාකරුවෙක් නම් 21වන සියවසට අයත් පන්ති කාමරය සැකසීම පිළිබඳ අදහස් හා යෝජනා විචාරාත්මකව දක්වන්න. (වචන 750ක් පමණ සෑහේ )



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# අමතර කියවීම

1. අතුකෝරල ඩී. ආර්. සහ අතුකෝරල එච්. එන්., අධ්‍යාපන මනෝ විද්‍යාව හා ගුරුවරයා (1992) ශික්ෂා මන්දිර ප්‍රකාශන, පානදුර.

2. ගජවීර ජේ., පන්ති කාමර කළමනාකරණය

3. වික්‍රමසිංහ එල්. කාර්යක්ෂම හා ඵලදායී ගුරුවරයකු වීමට නම්

4. කලුආරච්චි කේ. ඒ. එස්. පී. කළමනාකරණය (අනුකලිත ප්‍රවේශය) 2000, කර්තෘ ප්‍රකාශන

5. කස්තුරිආරච්චි, සී. අධ්‍යාපන කළමනාකරණය 2009

6. කොතලාවල, එල්. සී. පියාජේගේ මනෝවිද්‍යා න්‍යාය (1979) ලේක් හවුස්, කොළඹ.

7. ජනාධිපති කාර්ය සාධන බලකාය - 1997 - සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

8. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිරාමුවක් සඳහා යෝජනා

9. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය.

10. Transforming School Education in Sri Lanka- 2011 - The world bank" Colombo office'

11. 21st Century skills-2020-Central boad of Secondary Education- India.

12. Characteristics of a 21st Century Classroom- 2008- http://woulibrary.wou.edu.my/weko/eed502/Characteristics_of_a_21st_Century_Classroom.pdf

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2 ශිෂ්‍යයා හඳුනා ගන්න

2.1 ශිෂ්‍යයා මැනවින් හඳුනාගන්න

2.2 ශිෂ්‍යයා හඳුනා ගැනීමට අදාළ මනෝවිද්‍යාත්මක න්‍යායයන්

2.2.1 මානව අවශ්‍යයතා පිළිබඳ ධූරාවලිය (ඒබ්‍රහම් මාෂ්ලෝගේ)

2.2.2 පින් පියාජේගේ ප්‍රජානන (බුද්ධි) වර්ධන න්‍යාය

2.2.3 සිග්මන් ප්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදී න්‍යාය

2.3 ළමා සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය

2.3.1 පෙර පාසල් අවධිය

2.3.2 ප්‍රාථමික පාසල් අවධිය

2.3.3 ද්විතියික පාසල් අවධිය

2.4 ශිෂ්‍යයා හඳුනා ගැනීමට භාවිතා කරන උපකරණ

2.4.1 නිරීක්ෂණය

2.4.2 පරීක්ෂණය

2.4.3 සම්මුඛ පරීක්ෂණ

2.4.4 ප්‍රත්‍යාවේක්ෂණ වාර්තා

2.4.5 ප්‍රත්‍යෙක අධ්‍යයනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.5 ළමා සංවර්ධනයට ආරය හා පරිසරයේ බලපෑම

## 2.6 විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හදුනා ගැනීම

### 2.6.1 විශේෂ අවශ්‍යතා ඇති ළමුන් යනු කවුරුන්ද?

### 2.6.2 විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වර්ග කරමු

### 2.6.3 විශේෂ අවශ්‍යතා තත්ත්වයන් කිහිපයක්

2.6.3.1 දෘශ්‍යාබාධිත

2.6.3.2 ශ්‍රවණාබාධිත

2.6.3.3 නියුරෝෂියා තත්ත්වයක් වන ඩිස්ලෙක්ෂියාව

2.6.3.4 ඉගෙනුම් ආබාධිත බව(සෙමෙන් ඉගෙන ගන්නා සිසුන්)

2.6.3.5 සුහග

2.6.3.6 විශේෂ අවශ්‍යතා ඇති ළමයි සම්බන්ධයෙන් ගුරු අධ්‍යාපනඥයන් වන අපෙන් උපදෙසක්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2. ශිෂ්‍යයා හඳුනා ගනිමු.



ඔබ ස්ථානීය දෙමාපියන්... දරු පැටියාගේ.

Click

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

''ජොන්ට ලතින් උගන්වන්නට පෙර ජෝන් ගැන හරි හැටි දැනගත යුතුව ඇත.''

ළමයා ප්‍රමාණයෙන් කුඩා මිනිසෙකු නොවේ. දරුවා වැඩිහිටියාට වඩා වෙනස්ය. දරුවාගේ නිදහස අගය කළ යුතුව ඇත .

# 2.1 ශිෂ්‍යයා මැනවින් හඳුනා ගන්න.

දරුවාගේ අනාගතය පෝෂණය කිරීමේ වගකීම ගුරුවරුන් වන ඔබ සතුය. දරුවාගේ ස්වභාවය හඳුනාගෙන අනාගතයට දිශාභිමුඛ කිරීමේ කර්තව්‍ය ඔබ හදවතින්ම කළ යුතුව ඇත . ඔබේ භූමිකාව 'ගුරු' යනුවෙනි. එහි අන්ධකාරය දුරු කිරීම යන්න ගැබ්ව ඇත . කාගේ අඳුරද ? වචනාර්ථයෙන් මුදු - මොළොක් - නොමේරූ-හෙමින් වැඩෙන - ළය - ළපටි ආදී දෑ ගැබ් වී ඇති ළමයාගේ අඳුර ය. එහෙයින් මනා ශික්ෂණයකින් විභව්‍යතා කළ එළි කර අනාගතයට මග පෙන්වීම ගුරුන් වන අප සතු වගකීමකි. ඔබ ආකෘතියක් වන්න. සුවිශේෂ ක්‍රම වේද තුළින් දරුවා හඳුනා ගන්න. සමීප කරගන්න. ජීවිතයේ හිඩැස් සම්පූර්ණ කරගන්න ඔවුනට උදව් කරන්න.

පාසල් පද්ධතිය තුළ සිදුවන සිදුවීම් දෙස බැලීමේ දී ළමයා මැනවින් හඳුනා නොගැනීම හා ළමයා හඳුනා ගෙන අදාළ පියවර නොගැනීමෙන් ශිෂ්‍ය - ගුරු දෙපිරසටම අහිතකර ප්‍රතිඵලයනට මුහුණ දෙන අවස්ථා බහුලව දක්නට ඇත . සියදිවි නසා ගැනීම්, වරදකරුවන් ලෙසට නීතියට හසුවීම්, පාසල් මාරු කිරීම,පාසලේ විනය බිඳ වැටීම්, විවිධ අපචාර වලට ශිෂ්‍ය යොමුවීම නිසා පාසලෙන් ප්‍රතික්ෂේප කිරීම් සිදුවේ. ළමයා ළමයෙන් ලෙස තේරුම් නොගැනීම මේ ගැටලු ඇති වීමට ප්‍රධානම හේතුව බව පෙනේ.

සමාජයේ ළමයාට හිමි තැන හඳුනා ගන්න. ළමයාගේ ස්වභාවය හඳුනගන්න. ඔබ ආදරණීය ගුරු පියෙකි. ගුරු අම්මෙකි. හෙවත් දරුවාගේ ස්ථානීය දෙමාපියෝ ය. එසේ නම් ඔබ ඉදිරියේ පෙනී සිටින්නේ ඔබේම දරුවෙකි. හදවතින් ළංකොට ගෙන අකුරු කරවන්න.




Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2.1.1 ළමයින්ට ලොවම දී ඇති තැන හා ළමා අයිතිවාසිකම්

## එදා සිට අද දක්වා





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

එදා ලෝක ඉතිහාසය තුළ ළමා අයිතීන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු වී නොතිබිණි.

**රෝම නීතියට අනුව**

ළමයා දෙමාපියන්ගේ විශේෂයෙන්ම පියාගේ දේපළක් ලෙස සැලකීම.

**ප්‍රංශ නීතිය අනුව**

ළමයා විකිණීමට මෙන්ම උකස් කළ හැකිය.

## ළමයින් පිළිබඳ විශේෂ අවධානයක් යොමු වූ අවස්ථා

- 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
  - ✓ අවුරුදු 18 ට අඩු අයෙක් 'ළමයා' බවට පිළිගන්නා ලදී.
  - ✓ අවුරුදු 15 ට අඩු දරුවන් යුද්ධයට සම්බන්ධ කර ගත නොගත යුතුය.
- 1959 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය

දරුවා යනු අයිතීන්ගෙන් යුක්ත පුද්ගලයෙකු බව පිළිගන්න ලදී

- 1979 එක්සත් ජාතීන්ගේ සංවිධානය - ළමුන්ගේ වසර ලෙස 1979 නම් කරන ලදී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## එක්සත් ජාතීන්ගේ සංවිධානය - 1959 සම්මත කළ ප්‍රකාශනයක්

- අඩු තරමින් ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලැබීමට ළමයාට අයිතියක් ඇත.එය නිදහස් මෙන්ම අනිවාර්ය විය යුතුය.තම විභවයතා දියුණු කර ගැනීමට, තනිව තීරණ ගැනීමට සමාජ වගකීම් වර්ධනයට හා සමාජයට අවශ්‍ය පුද්ගලයෙකු වීමට ඉඩ සැලසිය යුතුය. තවද තමාට අහිතකර ඕනෑම අවස්ථාවක දී හෝ යම් දඬුවමකට එරෙහිව නැගී විටීමට එම සම්මුතියෙන් ආරක්ෂාව ලබා දී ඇත .
- විශ්ව ළමා වර්ෂය ලෙස 1979 නම් කර, ළමයාගේ සුබ සිද්ධිය ඉලක්ක කරමින් දරුවාට වැඩි අවධානයක් යොමු කළ යුතු බවට ලොව සෑම රටකටම පණිවිඩයක් දී ඇත .

## ළමයා - තරුණා නිර්වචනය - ලංකාවේ වලංගු නීතියට අනුව

- අවරුදු 18 දක්වා - ළමයා
- අවුරුදු 18 - 22 දක්වා තරුණයා

**නඩත්තු ආඥා පනත**

ළමයාව නඩත්තු කිරීම මූලික වගකීම දෙමාපියන් සතුය. සාමාන්‍ය දරුවෙකු අවුරුදු18 තෙක් නඩත්තු කළ යුතුය.

## ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය - 1989 - ☛ වන ව්‍යවස්ථාව

- වයස අවුරුදු 18 ට අඩු සෑම මනුෂ්‍යයකුට ළමයෙකු සේ සැලකේ.
- 1989 ළමා අයිතිවාසිකම් ප්‍රඥල්තියට - 1991 දී ලංකාව අත්සන් කරන ලදී .

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

හිතාමතා කරනු ලබන ගබ්සාව වරදක් ලෙස සැලකේ. දරුවාට මව්කුස පිළිසිද ගත් පසු නිරුපද්‍රිතව ඉපදීමට අයිතියක් ඇත .

- ශ්‍රී ලංකා නීතිය පිළිගෙන ඇත . -

මව්කුස පිළිසිඳ ගත් දරුවාට සිය දෙමාපියන්ගෙන් හෝ ඥාති පරපුරෙන් දේපළ හා ධනය හිමිකර ගැනීමට අයිතියක් ඇත .

- ශ්‍රී ලංකාවේ සිවිල් නීතිය -

## - යුනෙස්කෝව -

- දිවි පැවැත්ම සඳහා ඉගෙනුම - 70 දශකය ආරම්භයේ දී ප්‍රකාශයට පත් කළ
- ඉගෙනුම ඔබ සතු වස්තුව - 1998 නිකුත් කළ
- ඩෙලොස් 1998 යුනෙස්කෝ වාර්තාවෙන් - 21 වන ශත වර්ෂයේ අධ්‍යාපනය සැලසුම් කිරීමේ දී - දරුවාට අධ්‍යාපනය දීමේ දී ඉගෙනුම ලබන්නෙකු ලෙස වැදගත්කම අවධාරණය කරන ලදී .

## 1945 - කන්නන්ගර යෝජනා අනුව,

- නිදහස් අධ්‍යාපනය.
- මවු බසින් අධ්‍යාපනය.
- පාසල් ළමුන්ට දිවා ආහාර ලබා දීම.
- මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කිරීම.

} සිසුන් වැඩිපුර පාසලට පැමිණීම වැඩිකර ගැනීමට

## ලංකාවේ අධ්‍යාපන යෝජනා

- සියලුම ළමයින්ට අධ්‍යාපනය ලබාදීමට.
- 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ළමුන්ගේ අභිරුචින්ට ගැලපෙන පරිදි උගෙනුමට අවස්ථාව ලබා දීම.
- 1991 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් සමාන්‍ය අධ්‍යාපනය.
- 1997 වාර්තාවට අනුව ළමුන් පාසල් නොයාමට හේතු විමසා ඊට අදාළව ප්‍රතිකර්ම කළ යුතු බව.

20 වන සියවස වන විට දෙමාපියන් විසින් ළමයාව ආදරයෙන් බලාගත යුතු බව අවධාරණය කර ඊට අදාළ නෛතික පදනම සකස් කරන ලදී.

# වෙනස් වන ලෝකයට මුහුණ දෙන්නට වෙර දරන දරු පරපුරට මෑත භාගයේ දී හිමි වූ වරප්‍රසාද.

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය
- ළඟම පාසල - හොඳම පාසල
- ඩිජිටල්කරණය
- සිසු රක්ෂණාවරණය

## <u>13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය</u>

- සාමාන්‍ය පෙළ සමත් - අසමත් භාවය නොසලකා 13 වසරක අධ්‍යාපනයක් ලැබීමට දරුවන්ට අවස්ථාව හිමි විය.
- මෙහිදී හඳුන්වා දුන් විෂය ධාරාව අංශ දෙකකින් සමන්විතය.

    01.පොදු විෂය ධාරාව

    02.ව්‍යවහාරික විෂය ධාරාව


- පොදු විෂය ධාරාව යටතේ පහත සඳහන් විෂයයන් මුල් මාස හය තුළ දී උගන්වනු ලැබේ.

    01.පළමු බස

    02.ව්‍යවහාරික ඉංග්‍රීසි

- ප්‍රතිලාභ ලබන්නන්.
    - රජයේ පාසල් වල සිසුන්
    - පෞද්ගලික පාසල් වල සිසුන් - අර්ධ
    - ජාත්‍යන්තර පාසල් වල සිසුන්
    - පිරිවෙන්

- මෙහි ප්‍රතිලාභ අංශ තුනකින් ක්‍රියාත්මකය



- සෞන්දර්ය රසාස්වාදය හා සබැඳි කුසලතා
- තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණ කුසලතා
- පුරවැසිභාවයට අදාළ කුසලතා
- සමාජ යහපැවැත්ම සඳහා අවශ්‍ය සෞඛ්‍ය හා ජීවන කුසලතා
- ව්‍යවසායකත්ව කුසලතා
- ක්‍රීඩා හා අනෙකුත් විෂය සමගාමී ක්‍රියාකාරකම්
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන්

ව්‍යවහාරික විෂය ධාරාව යටතේ විෂයයන් 26ක් හඳුන්වා දී තිබේ.

- ✓ ළමා  මනෝ විද්‍යාව හා ආරක්ෂණය
- ✓ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය
- ✓ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා
- ✓ කාර්ය සිද්ධි කළමණාකරණය
- ✓ ශිල්ප කලා
- ✓ අභ්‍යන්තර නිර්මාණකරණය
- ✓ විලාසිතා නිර්මාණකරණය
- ✓ ග්‍රැෆික් නිර්මාණයකරණය
- ✓ කලාව හා පිරිසැලසුම්කරණය
- ✓ භූ දර්ශන නිර්මාණකරණය
- ✓ ව්‍යවහාරික උද්‍යාන විද්‍යා හා තා. අ.
- ✓ පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය
- ✓ සංචාරක හා ආගන්තුක සත්කාර
- ✓ ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
- ✓ ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය
- ✓ වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
- ✓ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යාපනය
- ✓ මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය
- ✓ විදුලි හා ඉලෙක්ට්‍රොනික් තා.අ.
- ✓ පේෂකර්ම ඇඟලුම් තාක්ෂණ අ.
- ✓ ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය
- ✓ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය
- ✓ මෘදුකාංග සංවර්ධනය
- ✓ වෙබ් නිර්මාණකරණය
- ✓ පාරිසරික අධ්‍යයනය
- ✓ කාර්ය සිද්ධි කළමණාකරණය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- මෙම වෘත්තීය විෂයයන් හදාරන අතරතුරදී ම ආයතනික පුහුණුවක්ද ලබා දෙන අතර එම කාලය තුළදී දිනකට රු.500 බැගින් වූ දීමනාවක් දෙනු ලැබේ.
- රැකියා පුහුණුව අවසානයේ NVQ Level 4 මට්ටමේ ප්‍රවීණතා සහතික සමග ශ්‍රී ලාංකා විභාග දෙපාර්තමේන්තුවේ වෘත්තිය අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකය පිරිනැමේ.

## ළඟම පාසල - හොඳම පාසල ව්‍යාපෘතිය

- මෙම සංකල්පය 2016 වසර තුළ හඳුන්වා දෙන ලද්දකි.
- මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දෙ පාසල් 7000ක භෞතික සම්පත් සංවර්ධන කිරීම අරමුණු කර ගෙනය.
- මෙම ව්‍යාපෘතිය මගින් නව පරිගණකාගාර, සුහුරු පන්තිකාමර, ද්විතියික තාක්ෂණ විද්‍යාගාර ද ඉදිකොට ඇත .
- මේ යටතේ සියලු පාසල් පිළිගත් එක් ප්‍රධාන සැලැස්මක් (Master Plan) අනුව සකස් කිරීම පියවරගෙන ඇත.
- සුපිරි පාසල් වෙනුවට ජන ඝණත්වය කේන්ද්‍ර කර ගනිමින් සියලු පහසුකම් සපිරි පාසල් ව්‍යුහයක් ඇති කිරීමටද කටයුතු කර ඇත.

## අධ්‍යාපන පද්ධතිය ඩිජිටල්කරණයට

- ඉ-තක්සලාව හඳුන්වා දීම
- ස්මාට් පන්තිකාමර සංකල්පය දියත් කිරීම
- සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සහතිකය On Line ක්‍රමයට ලබා ගැනීමේ අවස්ථාව හිමිවීම.
- 5 ශ්‍රේණියේ සමතුන්ට ශිෂ්‍යාධාර මුදල් On Line ක්‍රමයට ලබා ගතහැකි වීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## සුරක්ෂා සිසු රක්ෂණාවරණය

- මෙය 2017 වසරේ ඔක්තෝම්බර් 1 වැනි දා සිට ක්‍රියාත්මකවන ව්‍යාපෘතියකි. දැයේ දරුවන් සැමදා ආරක්ෂා කිරීමට සඳහා රක්ෂණාවරණයක් සපයීම අරමුණු කර ගෙන හඳුන්වා දෙන ලද්දකි.
- නිදහස් අධ්‍යාපනයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරන මෙමගින් අවු.5-19 වයස් සීමාවේ සිටින දැයේ දරුවන් සියලු දෙනාටම ප්‍රතිලාභ හිමි වෙයි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.2 ශිෂ්‍යයා හඳුනා ගැනීමට අදාළ මනෝ විද්‍යාත්මක න්‍යායයන්.

2.2.1 මානව අවශ්‍යතා පිළිබඳව ධූරාවලිය -


-ඒබ්‍රහම් මාෂ්ලෝගේ-



2.2.2 ජීන් පියාජේගේ ප්‍රජානන (බුද්ධි) වර්ධන න්‍යාය.



2.2.3 සිග්මන් ප්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යාය.





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


# 2.2.1 මානව අවශ්‍යතා පිළිබඳ ධූරාවලිය. - මාස්ලෝගේ

- පහළම මට්ටමේ ඇත්තේ මූලික කායික අවශ්‍යතාවන් ය.
- ඒවා ඉෂ්ට වූ කළ පුද්ගලයා අනෙක් අවශ්‍යතා සඳහා පොලඹවනු ලබයි.
- අදාළ අවශ්‍යතා ඉටුකර ගැනීමට පෙලඹෙන්නේ ක්‍රමයෙන් පහළ සිට ඉහළට යන අනුපිළිවෙළිනි.

ආදරයයි පිළිගැනීමයි ළමයාට අවශ්‍යමයි. Click

## මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය

මනුෂ්‍ය අවශ්‍යතාවන් කිසියම් අනුක්‍රමාධිපත්‍යයකට ක්‍රියාත්මක වන බව මාස්ලෝ ප්‍රකාශ කොට ඇත්තේ මෙසේ ය.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5.6.7.8.
ඉහළ මට්ටමේ අවශ්‍යතා ඉටු කර ගනියි.
අභියෝගතා දියුණු කර ගනියි.
උසස්ම දියුණුව ලැබුමට පෙලඹෙයි.

තෘප්තිමත් වී ඊළඟ අවශ්‍යතාවට යාමට පෙලඹේ

4. අවශ්‍යතාව
ඇගයීම,නම්බුව,කීර්තිය,ප්‍රසිද්ධිය, සැළකිල්ල,
ගරු බුහුමන් ලැබුමට දරුවා කැමතිය.
ගුරුවරු-දරුවාට හොඳයි කීම, ප්‍රශංසා කිරීම,
හරි දැමීම, තරු ලකුණු දීම, සම්මාන
සහතික පිරි නැමීම, තෑගි දීම කළ යුතුයි.

තෘප්තිමත් වූවිට ඉහළ අවශ්‍යතා ලැබුමට පෙලඹෙයි.

3. අවශ්‍යතාව
දෙමාපිය-ගුරු-ඥාති-අසල්වැසි ආදරය
පිළිගැනීම අවශ්‍යය. ගුරුවරයා සැරපරුෂ
නොවිය යුතුය. මේවා නොලැබුනු විට
ඉච්ඡාභංගත්වයට හා වැරදි ක්‍රියාවලට යොමු වේ.

අවශ්‍යතාව ඉටුවූ විට ඉහළ අවශ්‍යතා ලැබුමට පෙලඹෙයි.

2. අවශ්‍යතාව
නිවසේ දී-දෙමාපිය අඬ දබර,
මව පියා මිය යාම, වෙන්වීම දඬුවම් දීම,
බැණ වැදීම, ගුරුවරයා දඬුවම් දීම,
දොස් පැවරීම
(ගුරුන්ගෙන් සැගවී සිටීමට සිතයි.
මෙහිදී ගුරුවරුන්, දෙමාපියන්ගෙන්
නොලැබෙන පිළිගැනීම්,ආදරය
දීමට සූදානම් විය යුතුයි. ඔබ
ස්ථානීය දෙමාපියන් විය යුතුයි.)

මූලික අවශ්‍යතා වලින් තෘප්තිමත් වූවිට ඉහළ අවශ්‍යතා ලැබුමට පෙලඹෙයි.

1. අවශ්‍යතාව
පාසල-ඉගෙනුම-ශිෂ්‍යයා මූලික අවශ්‍යතා
වලින් තෘප්තිමත් වන ලෙසට දරුවාගේ
නිවසේ හා පාසල් පරිසරය සකස් විය යුතුය.



Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ඔබට උපදෙස්:-

- ඉහළ අවශ්‍යතා ලැබුමට 'පෙලඹවීම' ක්‍රමයෙන් සිදු කරවන්න.
- අවශ්‍යතා ක්‍රියාවලිය හඳුනාගෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරන්න.
- පන්ති කාමර ක්‍රියාකාරකම් ප්‍රබෝධාත්මකව ,ශිෂ්‍ය අභිරුචින්ට අනුව සැලසුම් කරන්න.
- වැඩි දෙනෙකුට ජයග්‍රහණය ලැබිය හැකි පරිදි පැවරුම් සංවිධානය කරන්න.
- අවශ්‍යතා තෘප්තිමත් වීමට අදාළව උපස්ථම්භන ලබා දෙන්න.
- දරුවාගේ මානසිකත්වය බිඳ වැටෙන, බලාපොරොත්තු කඩ කරන ඇණුම් පද කීම්,අයහපත් ආමන්ත්‍රණ, අනවශ්‍ය දඬුවම් ආදී දෑ නොකරන්න.
- ධනාත්මක සිතුවිලි ඇති කොට 'හැකිය' යන්න ඒත්තු ගන්වා අදාළ ඉහළම තැනින් ශිෂ්‍යයා ඔසවා තැබුමට කටයුතු සත්භාවයෙන් සිදුකරන්න.

**මෙය ශිෂ්‍ය චර්යාව තේරුම් ගැනීමට උපකාරී වන කදිම න්‍යායක් බව වටහා ගන්න.**

Iscolee.blogspot



ගීතය රස විඳීන්න පණිවුඩයක් හිතට ගන්න.

Click

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.2.2 ළමා සංවර්ධනය පිළිබඳ ජීන් පියාජේගේ ප්‍රජානන (බුද්ධි) වර්ධන න්‍යාය - සැකෙවින්.........

**ප්‍රජානන වර්ධනය යනු....**

දරුවෙකු ඉපදීමේ සිටම අවට ලෝකය පිළිබඳ දැනුම, අවබෝධය ගොඩනගා ගනිමින් ස්වකීය බුද්ධිය වැඩි දියුණු කර ගැනීම ය.

**ප්‍රජානනයට අයත් ක්ෂේත්‍ර**

මෙහි දී මතක තබා ගැනීම, සංජානනය, දැක්ම,සිතීම, ගැටලු විසඳා ගැනීම, සංවිධානය, තීරණ ගැනිම, පරිකල්පනය මේවා සංවර්ධනය කර ගැනීමෙන් බුද්ධිය වර්ධනය වේ,අත්දැකීම්,වචන කතා කිරීම, වචනවල තේරුම් දැනගැනීම

**පියාජේගේ සමීප අත්දැකීම්**

දරුවා උපත් මෙහොතේ සිට අවු.18 දක්වා ඉහත හැකියා හා ක්‍රියාකාරකම් දරුවා තුළ කවර කාල සීමා තුළ සිද්ද වේද? එසේ වන්නේ කවරාකාරයෙන් ද? යන්න සොයා බලා නිරීක්ෂණය කර, පරික්ෂණ මගින් තහවුරු කොටගෙන න්‍යායක් වශයෙන් එළි දක්වන ලදී .

**සමස්ත න්‍යායේ හරය වන්නේ**

දරුවාගේ වයසත් සමග බුද්ධිව වර්ධනය වන අයුරු කියා පායි.
දරුවා පරිසරය සමග ගැටීම නිසා බුද්ධිය වර්ධනය වන බව.

**බුද්ධි සංවර්ධනයේ දී මතු වන ලක්ෂණ 2කි.**

1. සංරක්ෂණ හැකියාව

සංවිධානය හා අනුවර්තනය අතර ඇතිවන සමතුලිත බවෙන් පසු පුද්ගලයා තුළ ඉතිරි වන බුද්ධිමය හැකියාව හෙවත් ද්‍රව්‍යයක වෙනත් ලක්ෂණ වෙනස් වුවද මූලික ලක්ෂණ වෙනස් නොවන බවයි.

2. ප්‍රත්‍යාර්තන හැකියාව

යම්කිසි චින්තන ධාරාවක කලින් තත්ත්වය කරා ආපසු යාමේ හැකියාවයි හෙවත් ආපස්සට සිතීමේ හැකියාවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# එක් එක් මානසික සංවර්ධනයේ දී අවධි අනුව ඉගැන්වීම සැලසුම් කර උපරිම ඉගෙනුමක් ලැබුමට දරුවාට උදව් කරන්න.

ඔබට වැදගත් වන බුද්ධි වර්ධනයේ අවධි 4ක් පියාජේ දක්වයි.

### 1. ඉන්ද්‍රිය චාලක අවධිය (උපතේ සිට අවු. 2 දක්වා)

- ☐ කිරි ඉරීම, යමක් අල්ලා ගැනීම, ශබ්ද නිකුත් කිරීම සිදුකරයි.
- ☐ ක්‍රමයෙන් යම් යම් ද්‍රව්‍ය සහ ඒවා අතර සම්බන්ධතාවයන් තේරුම් ගනියි.
- ☐ ශබ්ද හා චලන අනුකරණය කරයි.
- ☐ ක්‍රීඩා කිරීම හා අනුකරණය සිදු කරයි.

### 2. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය (අවු. 2 සිට අවු. 7 දක්වා කාලය)


- ☐ භාෂාව හසුරවයි.
- ☐ ආත්ම කේන්ද්‍රීයයි.
- ☐ එක් අවස්ථාවක දී එක් හේතුවක් පමණක් දකියි.
- ☐ සිද්ධියක සමස්තය නොදකියි.
- ☐ සංරක්ෂණ හැකියාව ඇත .
- ☐ ආපස්සට සිතීමේ හැකියාව නැත.

### 3. සංයුත්ත චින්තන අවධිය (අවු.7 -අවු. 11 දක්වා කාලය)

- ☐ තාර්කික ලෙස සිතයි.
- ☐ වර්ග කිරීමේ හැකියාව ඇත.
- ☐ ද්‍රව්‍ය පිළිවෙළට සකස් කරයි.
- ☐ ප්‍රමාණය, බර, පරිමාව තේරුම් ගනියි.
- ☐ ප්‍රත්‍යාවර්තන හැකියාව ඇත.
- ☐ ආත්ම කේන්ද්‍රීය චින්තනයෙන් මිදෙයි.
- ☐ සංයුක්ත ද්‍රව්‍ය ඇසුරෙන් ගැටළු විසඳයි.

### 4. විධිමත් චින්තන අවධිය (අවු. 12 - යෞවන වයස් සීමාව දක්වා.)

- ☐ තාර්කික චින්තනය පහළ වේ.
- ☐ මුල් අවදියේ දී සංයුක්ත දෑ ඇසුරෙන් ගැටලු විසඳයි.
- ☐ වියුක්ත චින්තන අවධියේ දී  වාචිකව ගැටලු නිරාකරණය කරයි.
- ☐ වියුක්ත සංකල්ප ඉගෙන ගනියි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පියාජේගේ න්‍යායෙන් කෙරෙන අධ්‍යාපනික ඇගයීම.

- සත්‍ය වූ ඉගෙනුම ළමයා තුළින් මතුවන්නක්.
- එය සක්‍රිය ගවේෂණ ක්‍රියාවලියක්.
- ළමයාට රුචි උපදවන ද්‍රව්‍ය ඇසුරෙන් ගැටලු විසඳීමට ඉඩ සලස්වන්න.
- දරුවන්ට රුචි ඉගෙනුම් ආකෘති විවිධ කාල වලදී අවශ්‍ය බව හිතට ගන්න.
- සැබෑ වස්තු සමග දරුවාට ක්‍රියාකාරී වීමට අවස්ථාව සලසා දෙන්න.
- සක්‍රිය ඉගෙනීම නිතරම රුචිපාදක වන බැවින් දරුවන් ක්‍රියාකාරී කරවීමට වග බලාගන්න.
- ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමට මග පාදන්න.
- සංයුක්ත සංකල්ප තුළින් වියුත්ත සංකල්ප ග්‍රහණයට අවස්ථාව ලබා දෙන්න.
- සක්‍රීය ඉගෙනුම් ආධාරක සහිත ප්‍රීතිමත් පන්ති කාමය දරුවාගේ ඉගෙනුම් ඵල සාක්ෂාත් කරන බව අමතක නොකරන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


# 2.2.3 සිග්මන් ප්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණවාදී න්‍යාය.

ප්‍රොයිඩ් ළමා සංවර්ධනය පිළිබඳ පවසා ඇති දෑ අධ්‍යයනය කරන්න. ශිෂ්‍යයා හඳුනා ගැනීමට ඔබට වැදගත් වේවි.

කුඩා කළ ළමයාගේ මනසේ ඇතිවන යම් යම් බලපෑම් පදනම් කරගෙන ප්‍රොයිඩ්ගේ මනෝ විග්‍රහවාදය ගොඩනැගී ඇත.

ළමා සංවර්ධනයට වැඩි වශයෙන් අදාළ වන්නේ පුද්ගල පෞරුෂ ව්‍යුහය හා මනෝ ලිංගික සංවර්ධන අවධි පිළිබඳව දැක්වූ අදහස් ය.

ප්‍රොයිඩ්ට අනුව, පුද්ගල පෞරෂයෙහි ස්වභාවය කෙටියෙන් දිග හරිමු.




- දළ සිත, ඉඩ් සංස්කාරය (පුද්ගල පෞරුෂයේ ජීව විද්‍යාත්මක පදනම)
- පහත් සිත, ඊගෝ සංස්කාරය උඩු සිත, (පෞරුෂයේ මනෝ විද්‍යාත්මක අංශය)
- උත්තරාත්මය, උපරිම අහංභාවය (පෞරුෂයේ සමාජ සංස්කෘතික අංශය/සදාචාර අංශය, හෘද සාක්ෂිය)

මිනිස් පෞරුෂය මේ අංශ තුනෙන්ම ඒකාබද්ධව අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය මත ගොඩනැගෙන බව ප්‍රොයිඩ් පවසයි. (මේවා මානසික බලවේගයන් සඳහා දී ඇති නම් පමණි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මෙතැන් සිට ඔබට මුණ ගැසෙන ළමයා පිළිබඳව චිත්තරූප මවා ගන්න. ඔහු / ඇය වෙනුවෙන් ගුරු මවක් ගුරු පියෙක් වන මට, කළ හැකි දේ සැලසුම් කොට දරුවා අදාළ තැනින් හැකි පමණ ඔසවා තැබූමට පියවර ගන්න.

උපතේදීම මනසේ ඇතිවන ආරම්භක අවස්ථාව ස්වභාවයෙන්ම අපරිණතයි, ආවේගාත්මකයි, අහේතුවාදීයි.

# Id



- අවශ්‍යතා කෙසේ හෝ වහා ඉටුකර ගනියි.
- සුඛවේදය මූලධර්මය අනුව කටයුතු කරයි.
- ළදරු කළ දරුවා Id ගුලියක්.
- පහත් මට්ටමේ ආශයක් අමු අමුවේ ඉටුකර ගනියි.
- මනුෂ්‍ය දරුවා ආත්මකේන්ද්‍රිය යි.
- ආත්මාර්ථකාමියි.
- සුඛවේදනය මූලධර්ම පාලනයකින් තොරව ක්‍රියාත්මක වූ විට පුද්ගලයාට මෙන්ම සමාජ පැවැත්මට අනතුරුදායකයි, ආක්‍රමණශීලියි.

'උපමාව' - 'එළිපෙහෙළි නොකරන ලද ගන වනාන්තරයකට'

➢ මනස තුළ සංවර්ධනය වන දෙවන අවස්ථාව

# Ego

- සැලසුම් කරයි, ගැටලු විසඳයි, හේතුසොයයි. Id පාලනය කිරීමද සිදු කරනු ලබයි.
- Id ගේ ආවේග බාහිර පරිසරයට අනුකූලව එළි දක්වන මාර්ගය සකස් කොට, එළි දක්වයි.
- විඥාණය, උපවිඥාණය නියෝජනය කරයි.
- මධ්‍යස්ථවාදීයෙක් වශයෙන් ක්‍රියාකරයි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

➢ මනස තුළ සංවර්ධනය වන තෙවන අවස්ථාව

# Super Ego

- Ego ගේ කොටස්කරුවෙක් වුවත්, පුද්ගලයාගේ සදාචාර අංශය නියෝජනය කරයි.
- දරුවා සිරිත් විරිත්, අගයන් උගෙනුමට පටන් ගැනීමත් සමඟ Super Ego සංවර්ධනය ආරම්භ වෙයි.
- මිනිස් පෞරුෂයේ ඉහළම කොටස යි.
- මේ මානසිකත්වය පුද්ගලයාට පහළ වන්නේ අවු. 3-5 අතර ඇතිවන හොඳ- නරක, හරි- වැරදි තේරුම් ගැනීමේ චින්තනයත් සමග ය.
- හෘද සාක්ෂිය අනුව කටයුතු කිරීමට එකතුවීම් කරන අවස්ථාව ය.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිග්මන් ෆ්‍රොයිඩ් - ළමා සංවර්ධන අවධි.


හොඳින් අධ්‍යයනය කරන්න. අපට මුණ ගැසෙන මේ සජීවී මිනිස් පැටියාව තේරුම් ගන්න.

| | | |
|---|---|---|
| 01.පූර්ව ලිංගික අවධිය | - | (මුඛීය/ගුද/ලිංග රූපික අවස්ථාවල පසු වේ.) උපතේ සිට අවු. 6 දක්වා |
| 02.ගුප්ත ලිංගික අවධිය | - | අවු. 6 - 12 දක්වා |
| 03.වැද්ධ ලිංගික අවධිය | - | අවු. 12න් පසුව |

## 01. පූර්ව ලිංගික අවධිය.

- මුඛීය අවධිය (උපතේ සිට අවු. 1-2 දක්වා)
  - දරුවා මුඛය මුල් කොටගෙන සතුට ලබයි. කිරි උරා බීම ප්‍රධාන කාර්යයයි. විරෝධය පෑම,දුක්වේදනා කියාපෑම, තම ගැටලු වෙනුවෙන් හඬක් නැගීම වැනි අදහස් සන්නිවේදනය කිරීමේ මාධ්‍ය මුඛය වේ.
  - ක්‍රියාකාරකම්
    උරාබීම (මව් කිරි, කිරිබෝතලය, සූප්පුව...) තලු මැරීම, තොලකට ලෙව කෑම.
  - හපයි, විකයි, තලුමරයි.
  - මුඛීය අවධියේ දී දරුවා නොසලකා හැරිය විට ➡ Super Ego වර්ධනය නොවේ.
  - දැඩි ආරක්ෂාව තුළ ➡ අවශ්‍ය ප්‍රමාණයට වඩා බලවත් වේ.
  - අවශ්‍ය ප්‍රමාණයට පමණක් තෘප්තිය ලැබූවිට ➡ සර්ව සුභවාදී පෞරුෂයකට උරුමකම් කියයි.
  - අවශ්‍ය ප්‍රමාණයට තෘප්තිමත් නොවූවිට ➡ සර්ව අශුභවාදී පෞරුෂයකට උරුමකම් කියයි.

- ගුද අවධිය (අවු. 2 - 4 දක්වා)
  - දරුවා මළපහ කිරීමෙන්, මුත්‍රා කිරීමෙන් තෘප්තියක් ලබයි.
  - වැසිකිළි යාමට පුහුණුව ලබයි.
  - මළ පහ කිරීම පාලනයට දෙමාපියන් ගන්නා උත්සහය Id ට තර්ජනයකි. නමුත් Ego වර්ධනය වන නිසා මළපහ තැලීමට ඉඩ නොදෙයි - මෙය ළමයා තුළ මානසික ගැටුමකි.
  - ගුද අවධිය තුළ පුහුණුව
    - නීති රීති ඇණුම් බැනුම් මැද ආකාරුණික නම් - ළමයා, මළපහ කිරීම වර්ජනය කරයි. බොහෝවේලා ගනියි. කල් දමයි. ළමයා පසු කළෙක මුරණ්ඩු හිතුවක්කාර ගති ඇත්තෙක් බවට පත් වේ.
    - දෙමාපියන් වුවමනාට වඩා සැලකිල්ල දක්වයි නම් - මළපහ කිරීමට වැඩි වටිනාකමක් දෙයි. පසු කළෙක ළමයා - අන්‍යයන් සතුටු කරයි. දන්දෙයි/ පරිත්‍යාගශීලී වෙයි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Iscolee.blogspot

❖ ලිංග රූපික අවධිය (අවු. 4 -6 දක්වා)

- ළමයා සතුට ආශ්වාදය ලැබුමට, තම ලිංගය කෙරෙහි යොමු වෙයි. - අතපත ගායි. නිරීක්ෂණය කරයි. සසඳයි, ප්‍රදර්ශනය කරයි. (මෙය ප්‍රජනන හෝ සුරතාන්තය අරමුණු කොට ගෙන නොවේ.)
- විරුද්ධ ලිංගික අවයව ද නිරීක්ෂණය කරයි. වෙනස්කම් දැක කුතුහලය උපද්දවා ගනියි. මූලික ලිංගික වෙස්කම් හඳුනා ගනියි. මෙහිදී,
  - ✓ ගැහැණු ළමයින් - හාවභාව විලාස පෑම (Coquettish)
  - ✓ පිරිමි ළමයි - හැඩි දැඩි වීර වික්‍රම බව නිරීක්ෂණය කරයි.

- වැඩිටියන් මේවා මර්ධනය කළ විට, ළමයාගේ සමාන්‍ය ලිංගික ජීවිතයට දැඩි බලපෑමක් ඇති කරයි.



## 02. ගුප්ත ලිංගික අවධිය (අවු.6 - 12 දක්වා)

❖ සාමන්‍ය පෞරුෂ ලක්ෂණ සම්පූර්ණ වීම සිදුවේ.

❖ සමාජ සම්බන්ධතාවලට රුචිකත්වය වඩයි.

❖ සැගවුණු මනෝ ලිංගික කරුණු වලින් යුක්තයි.

❖ ඉගෙනීමට, ක්‍රීඩාව වැනි ක්‍රියාකාරකම් වලට ප්‍රියයි.

❖ පිරිමි ළමයා - පිරිමි, ගැහැණු ළමයා - ගැහැණු වශයෙන් සබඳතා පවත්වයි.

❖ මිශ්‍ර කණ්ඩායම් දැකිය නොහැකියි.



# 03. වැද්ධ ලිංගික අවධිය (අවුරුදු 12න් පසුව)

- ❖ නව යොවුන් වියයි.
- ❖ ලිංගික පරිණාතියක් සිදුවේ.
- ❖ විරුද්ධ ලිංගික ඇසුරට අවධානය යොමු කරයි.
- ❖ විනය හා වගකීම ගොඩනගා ගනියි.
- ❖ පුද්ගලයාට ප්‍රජනන ශක්තිය ලැබේ.
- ❖ ප්‍රජනන හැකියාව ලබයි. - දරුවන් බිහි කිරීමට (සංකීර්ණ අවධියකි.)
- ❖ සාර්ථක ලෙස ගතකරන පරිපුන් වැඩිහිටියෙකු බවට අවතීර්ණ වීමට නම්, පූර්ව අවධීන්වල අත්පත් කරගත යුතු මානසික ගති ලක්ෂණ අවශ්‍ය ප්‍රමාණයට ලබා තිබිය යුතුයි. නොවනු විට පසුකාලීනව ගැටලු ඇතිවනු ලැබේ.
- ❖ ෆ්‍රොයිඩ් පවසන්නේ, ඊළඟ අවධීන් ගොඩ නැගී ඇත්තේ පූර්ව අවධියේ වර්ධනය මත බවයි.



ශිෂ්‍යයා හඳුනා ගන්න, ළමා සංවර්ධනය පිළිබඳ ප්‍රොයිඩ්ගේ න්‍යාය තවදුරටත් අධ්‍යයනය කරන්න.

## 2.3 ළමා සංවර්ධනය පිළිබඳව අධ්‍යයනය

ළමා සංවර්ධනය පිළිබඳ අදහස් දැක්වූ මනෝවිද්‍යාඥයින්, දාර්ශනිකයන් අතර ජීන් පියාජේ, ජීන් ජැක් රූසෝ,සිග්මන් ප්‍රොයිඩ් වැනි අයට ප්‍රධාන තැනක් හිමි වේ. ඔබ මෙම සජීවී සක්‍රීය දරු පැටියාව හඳුනා ගන්න ඒවා අධ්‍යයනය කරන්න.

ළමා සංවර්ධනය අවස්ථා හතරක් යටතේ දක්වයි. මෙම සිව් වැදෑරුම් වර්ධනය එකිනෙකට සම්බන්ධ වෙමින් පවතින්නක් බව ඔබට හැගෙයි.

- ශාරීරික වර්ධනය
- මානසික වර්ධනය
- චිත්තවේගිය වර්ධනය
- සමාජයීය වර්ධනය

එසේම ළමා සංවර්ධනය පාසල් අවධීන් වශයෙන් සලකා වර්ධය පිළිබඳ අධ්‍යයනයේ යෙදීම ගුරුවරුන් වන ඔබට වැදගත් වේ. එහිදී ඒ සෑම සංවර්ධන අවධියකම අඩු වැඩි ලෙස ඉහත අවස්ථා හතර මුසුවන බව ඔබට පෙනේ.

2.3.1 පෙර පාසල් අවධිය - අවු. 2 - අවු. 5 දක්වා

2.3.2 ප්‍රාථමික පාසල් අවධිය - අවු. 5 - අවු. 11 දක්වා

2.3.3 ද්විතීයික පාසල් අවධිය - අවු. 11 - අවු. 18 දක්වා

ඔබට වැදගත් නිසා අපි මෙතැන් සිට මේ අවධිවල දී සංවර්ධන අවස්ථා හතර තුළ ශිෂ්‍යායාගේ ස්වරූපය අධ්‍යයනය කරමු.



# 2.3.1 පෙර පාසල් අවධිය

## අවු. 2 - අවු. 5 දක්වා

| ශාරීරික වර්ධනය | මානසික වර්ධනය |
|---|---|
| ➢ ස්නායු ඇට, පේශි පරිනත වේ.<br>➢ කිරිදත් වැඩී ඇත.<br>➢ දිවීම, පැනීම, නැගීම සිදු කරයි.<br>➢ මොළය වැඩිහිටියෙකුගේ මෙන් 90% පමණය. | ➢ වේගවත් බුද්ධි වර්ධනය.<br>➢ වේගවත් භාෂාවේ වර්ධනක් (වාග් කෝෂය වචන 2000න් පමණි)<br>➢ කුතුහලය, ප්‍රශ්න කිරීම, නිරීක්ෂණ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>➢ ද්‍රව්‍ය හා අත්දැකීම් මත දැනුම ලබා ගනියි.<br>➢ මනඃකල්පිත බව වැඩිය.<br>➢ ආපස්සට සිතිය නොහැක.<br>➢ සංරක්ෂණ හැකියාව.<br>➢ තර්කනය නැත. |
| **චිත්තවේගී වර්ධනය** | **සමාජයීය වර්ධනය** |
| ➢ නිතර වෙනස් වන චිත්තවේගී තත්ත්වය<br>➢ මානසික අවශ්‍යතා ඉටුවීමෙන් චිත්තවේග වර්ධනය වේ.<br>➢ චිත්තවේග වශයෙන් වෙහෙසකර අවධියකි. | ➢ පවුල හා සමාජය අතර අන්තර් සබඳතා සමාජීය වර්ධනයට හේතුවෙයි.<br>➢ සංස්කෘතියට එකතුවීම් ලබයි.<br>➢ දෙමාපිය සැලකිල්ල අනුව සදාචාරා සිරිත් විරිත් අනුගමනය කරයි.<br>➢ මිතුරන් සමග සුළු වේලාවක් සෙල්ලම් කළ හැක. |



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2.3.2 ප්‍රාථමික පාසල් අවධිය

අවු. 5 - අවු. 11 දක්වා

| ශාරීරික වර්ධනය | මානසික වර්ධනය |
|---|---|
| ➢ වර්ධනය අඛණ්ඩය පෙරමෙන් වේගවත් නැත. (අත් පා,උස, බර, වැඩි වර්ධනයකි)<br>➢ ස්නායු, ඇට,පේශි, වර්ධනය වේ.<br>➢ කිරිදත් වැටී ස්ථිර දත් එයි.<br>➢ ශාරීරයේ නියම හැඩය ඇතිවේ.<br>➢ ඉන්ද්‍රිය සමායෝජනය දියුණු වේ.<br>➢ චාලක ක්‍රියා කළ හැකිය.<br>➢ සියලු මාංශ පේශී වර්ධනය වේ. | ➢ සංකල්ප සාධනයට යොමුවෙයි.<br>➢ ඉන්ද්‍රියන් හා ද්‍රව්‍ය මුල් කරගත් ක්‍රියාකරකම් කරයි.<br>➢ සංයුත්ත වස්තු පිළිබඳව අවබෝධය වැඩියි.<br>➢ 'සංරක්ෂණ' හැකියාව ඇත. (ද්‍රව්‍යයක වෙනත් ලක්ෂණ වෙනස් වුවද මූලික ලක්ෂණ වෙනස් නොවන බව ඇත.)<br>➢ ආපස්සට සිතීම වැනි බුද්ධි ලක්ෂණ පහළ වෙයි.<br>➢ කුතුහලය ඇත.<br>➢ වියුක්ත දේ ගැන තර්කානු කූලව සිතිය නොහැක. |
| **චිත්තයේගීය වර්ධනය** | **සමාජයීය වර්ධනය** |
| ➢ සෑහෙන දුරට චිත්ත වේගය පාලනය කරයි.<br>➢ චිත්ත වේගී - සංසුන් අවධියකි. (මානසික අවශ්‍යතා ඉටු වීම මත.)<br>➢ ආදරය, පිළිගැනීම,සුරැකියාව ගැන නව අත්දැකීම් ලබයි. ඒවා අවශ්‍යයයි.<br>➢ වැඩිහිටි අනුමැතිය අවශ්‍යයයි - ගෞරවයක් වැඩිහිටියන්ගෙන් පතයි.<br>➢ තහංචි, දඬුවම් හොඳ නැත. | ➢ පවුල පාසල සම වයස් මිතුරන් බලපායි.<br>➢ රුචිකම් මත මිතුරු කණ්ඩායම් ඇතිවේ. නමුත් තාවකාලිකයි.<br>➢ ගැහැණු, පිරිමි වෙන් වෙන්ව කණ්ඩායම් වේ.<br>➢ සදාචාරයට ක්‍රමයෙන් යොමු වේ.<br>➢ කණ්ඩායම් තුළින් - නායකත්වය, සාමූහිකත්වයට සහයෝගයට හුරු වේ. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2.3.3 ද්විතීයික පාසල් අවධිය

අවු. 11 - අවු. 18 දක්වා

## ශාරීරික වර්ධනය

- වර්ධනය වේගවත් ය. (ස්ත්‍රී- -පුරුෂ)
- පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමයි පරිනතියට පත් වේ. - වැඩිහිටියෙකුගේ ස්වභාවය ගනී.
- බාහු, කඳ, උස, බර ශරීරය වැඩීමේ ලක්ෂණ වේගවත් වේ.
- නිර්ණාල ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය ඇති වේ.
- ලිංගේන්ද්‍රය වර්ධනය සිදුවේ.
- දෙපක්ෂයටම වර්ගයා බෝගිරීමේ හැකියාව ඇතිවේ.

## මානසික වර්ධනය

- සංකල්ප වර්ධනයේ දියුණුම අවස්ථාව ලබයි.
- වියුක්ත චින්තනය ඇති වේ.
- කල්පිත ගොඩනගයි.
- විද්‍යාත්මක ප්‍රශ්න, වියුක්ත ප්‍රශ්න, න්‍යායත්මක ප්‍රශ්න විසඳයි.
- අර්ථ කථන දක්වයි.
- ගැඹුරු සංකල්ප තේරුම් ගනියි. (විද්‍යාව, ගණිතය, ආගම, දර්ශනය ආදියේදී..)

## චිත්තවේගීය වර්ධනය

- වේගවත් ශරීර විර්ධනය මත චිත්තවේගික ගැටලු රාශියක් මතුවේ.
- වැඩිහිටියන් හා ගැටුම් ඇති වේ. (නිදහස, පරමාදර්ශය, ලිංගික ලැදියා, සමවයස් කණ්ඩායම් ගැන)
- ශාරීරික වෙනස නිසා - ලැජ්යාව, කුතුහලට ඇති කර ගනීය.
- රූප ශෝභාව, පෙනුම, පිරිසිදුකම, ගැන සැලකිල්ල වැඩිය.
- තව දුරටත් වැඩිහිටි ආරක්ෂාව ආදරය පතයි.
- ළමා වියත්, වැඩිහිටිවියත් අතර අතරමං වූවෙත් සේ දැනෙයි.

## සමාජයීය වර්ධනය

- සම වයස් කණ්ඩායම් ඇසුර බලවත් ය.
- විරුද්ධ ලිංගික ඇසුරට ප්‍රිය කරයි.
- ගැහැණු හා පිරිමි එකම කණ්ඩායමක්.
- පොදු හැඟීම, පරමාදර්ශී බව,වීරත්වය, තදාත්මිකරණය ඇත.
- පවතින දුර්වලතා විවේචනය කරයි.
- අන්‍යොන්‍ය ගරුත්වය පිළිගැනීම අපේක්ෂා කරයි





අපි දන්නවා ඔබට ගුරු ජීවිතයේ දී ගොඩක් ඉවසන්න වෙන කාලය 9,10,11,12 ශ්‍රේණිවල සිසුන් සමඟ අකුරු කරන කාලය බව. ඔබ නිසියාකාරව එම ශිෂ්‍යා අධ්‍යයනය කර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අවතීර්ණ වුවෙත් එය ඉතාමත් සුන්දර කාලවකවානුවකි. ගුරු දිවියේ සදාදරණීය මතක සටහන් තබන අවධියක් බව දැනේවි.

ඉදිරි අත්දැකීම් ලබන ඔබට ඒ සඳහා ...පහත සංවාද උදව් කරාවි. කියවන්න....

ආකාශ් හා පුලස්ති එකම පන්තියේ මිතුරෝ වෙති.

ආකාශ්:- 'මොකද ඔය මූණෙ හැටි විතරක්.'

පුලස්ති:- 'ඔව් මේ දවස්වල මට ටිකක් නින්ද යනවත් හොරයි.'

'අම්මා හැමවෙලාවෙම කියනවා ඔය දැලි රැවුල කපා ගන්න කියලා.'

ආකාශ්:- 'ඉතිං කපා ගන්නකෝ මේ මං වගේ.'

පුලස්ති:- 'ඊට වඩා පට්ට ප්‍රශ්න ගෙඩාක් මට තියෙනවා බං.'

අවුරුදු 20 වයසැති දියණිය සමග අම්මා හෙමිහිට කතාබහක.

අවුරුදු 15ක් වයසැති මල්ලී එතනට එයි. කතා බහට හොරෙන් කන්දී ඇති බව සැක සහිත, කළ කිරීම මුසු බැල්මෙන් දෘශ්‍යමානයි.

මල්ලි ඉතාමත් අවේගශීලීව....

'අක්කේ; මට දෙන්න කැරට් අලයක් හප හපා ඉන්න. මම හාවෙක් කියලා හිතුවද?'

අම්මා සහ අක්කා නිරුත්තර වෙති. එහි ගැබ් ව විශාල

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ඔබව හමුවෙන ශිෂ්‍ය හඳුනා ගන්න. තාත්ත යි මම යි.... කියවන්න.



- මට වයස අවුරුදු 4 යි
  මගේ තාත්තට මේ ලෝකේ ඕනෙම දෙයක් කරන්න පුළුවන්.

- මට වයස අවුරුදු 5 යි
  මගෙ තාත්ත නම් ඕනෙම දෙයක් දන්නවා

- මට වයස අවුරුදු 7 යි
  ඕගොල්ලන්ගෙ තාත්තා වගේ නෙමෙයි අපේ තාත්තා හරිම දක්ෂයි.
  එයා හරි උසත් එක්ක.



- මට වයස අවුරුදු 10 යි
  අපේ තාත්තා හැම දෙයක් ගැනම හරියට දන්නෙ නෑ වගෙයි මට හිතෙන්නෙ.


- මට වයස අවුරුදු 12 යි
  තාත්තලගෙ කාලේ දැන් වගේ හැම දෙයක්ම දියුණු නෑනේ.....

- මට වයස අවුරුදු 15 යි
  අපෝ! ඒක හරි අමුතු දෙයක්. තාත්තට ඒවා තේරෙන්නෙ නෑ.

- මට වයස අවුරුදු 18 යි
  එයාව ගනං ගන්න එපා මචං, එයාට හණමිටි අදහස්නෙ තියෙන්නේ.

- මට වයස අවුරුදු 21 යි
  අපේ තාත්තා එක එක පිස්සුනෙ බං දොඩවන්නේ.
  දැන් කාලෙට ඒවා ගැලපෙන්නේ නෑ.

කිසිවෙකුටත් අයිති නැති භූමියක්.
චන්ඩමාරුත හමන කාලයක්
චිත්තවේග වල යුධ පිටියක්.
කුණාටුවලින් ගහන වූ සමයක්.



- මට වයස අවුරුදු 26 යි
  තාත්තා ඒ ගැන ටිකක් විතර දන්නවා වගේ.
  මොකද එයා හුඟක් කල් ඒවත් එක්ක වැඩ කළානේ.

- මට වයස අවුරුදු 30 යි
  තාත්තගෙන් ඇහුවොත් හොඳයි වගේ.
  මොනවා වුනත් තාත්තට හුඟක් අත් දැකීම් තියනවනේ.

- මට වයස අවුරුදු 36 යි
  අපෝ! මම නම් ඔය වැඩේට අත ගහන්නෙ නෑ තාත්තගෙන් අහල මිසක්.



- මට වයස අවුරුදු 45 යි
  මට හිතාගන්න බෑ තාත්තා කොහොම මේවාට මුහණ දුන්නද කියලා.
  තාත්තා හරිම කල්පනාකාරී කෙනෙක්.
  ඒ වගේම ඕනෙම ප්‍රශ්නයක් නිවැරදිව විසඳන විදිහ දන්නවා

- මට වයස අවුරුදු 50 යි
  අනේ තාත්තා අද හිටිය නං දෙවියනේ!

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.4 මේවා ශිෂ්‍යයා හඳුනා ගැනීමට භාවිතා කරන උපකරණ.

සිසුන්ට ඉගැන්වීමේ දී ඔවුන් හඳුනා ගැනීම ඉතා වැදගත්. ශිෂ්‍යයා හඳුනා නොගෙන ඉගැන්වීමට යාමෙන් ඔබ අපහසුතාවට පත්වන බව අපි දනිමු. ඒ නිසාම ශිෂ්‍යයා හඳුනා ගැනීමේ උපකරණ පිළිබඳව ගුරුන් වන ඔබ දැනුවත් විය යුතුමය.

ශිෂ්‍යයා හඳුනා ගන්න මෙවැනි උපකරණ භාවිත කරන්න.

- 2.4.1 නිරීක්ෂණය
- 2.4.2 පරීක්ෂණ
- 2.4.3 සම්මුඛ පරීක්ෂණ
- 2.4.4 ප්‍රත්‍යාවේක්ෂණ වාර්තා
- 2.4.5 ප්‍රත්‍යේක අධ්‍යයන







Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.4.1 නිරීක්ෂණය - Observation

පන්ති කාමරය තුළත් ඉන් පිටතත් සිසුන් නිරීක්ෂණය තුළින් ඔබට ඔවුන් පිළිබඳව බොහෝ දෑ අවබෝධ කරගත හැකිය. ශිෂ්‍ය හැසිරීම, අවස්ථාව, ද්‍රව්‍ය පිළිබඳ ඔබට පෙනෙන දේ පැහැදිලිව තේරුම් යා නම් එය නිරීක්ෂණය ලෙස අර්ථ ගැන්විය හැකිය. ඒ සඳහා සැලසුම් කළ දෙනෙතක් හා මනසක් ගුරුන් වන ඔබ සතු විය යුතුය.




දැන් ඔබට දැනෙනවා ඇති ගුරු භූමිකාව තුළ දක්ෂ නිරීක්ෂකයෙක් සිටින වග.ඔබේ නිරීක්ෂණය අවදි කරන්න. එමගින් ඔබේ ගුරු භූමිකාව වඩාත් ප්‍රභාවත් වනවා නොඅනුමාන යි.



Iscolee.blogspot

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.4.2 පරීක්ෂණ - Test

ඔබට දරුවන් හඳුනාගත හැකි තවත් වැදගත් උපකරණයකි, පරීක්ෂණ, ඔබ ගනුදෙනු කරන්නේ සක්‍රීය මිනිස් දරුවා සමඟයි. පුද්ගලයකු හෝ කණ්ඩායමක තත්ත්වය පරීක්ෂා කිරීම මෙමගින් සිදු වේ. පරීක්ෂණ වර්ග කිහිපයක් ඇති බව මේ වන විටත් ඔබ නොදැන සිටිනවා නොවේ.

| විෂය මූලික සාධන පරීක්ෂණ<br>Achievement Test | මනෝ විද්‍යාත්මක පරීක්ෂණ<br>Psychological Test | සමාජ මිතික පරීක්ෂණ<br>Sciometric Test |
|---|---|---|
| • විෂය මූලිකව සාධක මට්ටම් මනින පරීක්ෂණ.<br>• මේ පිළිබඳව ඔබට බෙහෙවින් අත්දැකීම් ඇත .<br>• මේවා තුළින් දරුවාගේ විෂය ය අඩුපාඩු හඳුනාගෙන ඒවා අවම කරගැනීමට ඔබට හැකියාව ඇත .<br>• විෂයයට ප්‍රශ්න පත්‍රයක් දුන් පසුව ලකුණු ලබා දීම පමණක් ප්‍රමාණවත් නොවේ. උත්තර පත්‍රය තුළින් දරුවාගේ දක්ෂතා හා දුර්වලතා හඳුනාගෙන ඊට අදාල ප්‍රතිකර්ම කළ යුතු වේ. විශේෂිත පරීක්ෂණ ලෙසද පරීක්ෂණය සැලසුම් කර සාධනය මැනිය හැකිය. | • මනෝ විද්‍යාත්මක ගැටලු විසඳීමට මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රයේ පරිහරණය කරන පරීක්ෂණ.<br>• අද මෙවැනි ගැටලු බහුල ය.<br>• ගැටලු සහිත දරුවන්ට ඔබ ඉගැන්වීමට යාමේදී අදාළ ඉගෙනුම් ක්‍රම තීර්ණය කිරීමටත් මෙමගින් පුළුවන.<br>• අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ මනෝවිද්‍යාත්මක පරීක්ෂණ සිදුකර ඇති බැවින් ශිෂ්‍යයා හඳුනාගැනීමට ඒවා අධ්‍යයනය කරන්න. | • සමාජ විද්‍යාත්මක බපලෑම් මත දරුවන්ට බොහෝ ගැටලු පැන නගියි.<br>• ඒවා ඉගෙනුමට බලපායි. ගුරුවරුන් වන ඔබට ගැටලුවක්.<br>• ගැටලු ඇති ළමයින් වහා හඳුනාගත යුතු ඇත. සමාජ මිතික පරීක්ෂණ ඔබට උපාකාරී වේ.<br>උදා:- මත් ද්‍රව්‍ය සඳහා ආබ්බැහිවී ඇති දරුවන්ට බලපෑ පාරිසරික හේතු සොයා බැලුමට... |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සිහි කැඳවා ගන්න. අවධානය යොමු කරන්න.

## 2.4.3 සම්මුඛ පරීක්ෂණ - Interview

වාචික ප්‍රශ්නාවලියක් තුළින්, මුහුණට මුහුණලා කෙරෙන සැලසුම් කළ කථා බහක් තුළින්, පුද්ගලයන් දෙදෙනෙකු අතර, කණ්ඩායමක් තවත් කණ්ඩායමක් අතර සාකච්ඡාවක් තුළින් සම්මුඛ පරීක්ෂණය සිදු කිරීමට පුළුවන. ඔබ සිසුන්ගේ ඉගෙනුම් පසුබටතා, ගැටලු පිළිබඳ අවබෝධයක් ලැබුමට සම්මුඛ පරීක්ෂණ උපයෝගී කරගෙන සුවිශේෂීව ශිෂ්‍යයා හඳුනා ගැනිමට අවස්ථාව ලබා ගන්න.





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

### 2.4.4 ප්‍රත්‍යාවේක්ෂණ වාර්තා. - Reflection Report

ප්‍රත්‍යාවේක්ෂණ ව්‍යවහාර යනු ; අධ්‍යාපන විද්‍යාත්මකව ජීවත් වීමේ ක්‍රියාත්මකවීමේ බුද්ධි ව්‍යායාමයකි.

මෙය ඔබේ ඉගැන්වීම් කාර්යය සංවර්ධනයටත් ශිෂ්‍යාගේ ඉගෙනීම සංවර්ධනයටත් වැදගත් විශිෂ්ට මාර්ගයකි.

අපේ අඩුපාඩු, දුබලතා, ප්‍රබලතා, හඳුනා ගැනීමට අපව මෙහෙය වන්නක්.

තමන්ට හමුවන ගැටලු හඳුනා ගැනීම හා විග්‍රහ කර ගැනීම සඳහා ඔබට වැදගත් වන ක්‍රමවේදයකි. ශිෂ්‍ය ජීවිතයේ මෙන්ම ගුරු ජිවිතයේ ද මුහුණ දෙන එදිනෙදා විශේෂ සිදුවීම් වාර්තාකරණය කිරීම සිදු වේ.

ඔබට ප්‍රත්‍යාවේක්ෂණයේදී වඩා සාධනීය සංවර්ධනයක් ලබා ගැනීමට නම් පහත සඳහන් කරුණු ඉටුකරන්න.

- තමා කළ කාර්යයන් ගැන සිතීම — Thinking
- පුනරාවර්ජනය — Rethinking
- ප්‍රත්‍යවේක්ෂණය — Reflection
- සහයෝගී චින්තනය — Join Thinking
- සාකච්ඡාව — Discussion
- වෙනස්වීම — Chang



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

### 2.4.5 ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය.

චර්යාවාදී විද්‍යා පර්යේෂණයන්හි විශේෂිත වූ පර්යේෂණ ක්‍රමයකි. පුද්ගලයකු එක්තරා ආකාරයකට ක්‍රියා කරන්නේ කුමක් නිසාද? අනාගතයේ ක්‍රියා කරන්නේ කෙසේද? යන්න පිළිබඳව අවබෝධයක් ලබයි. ගැඹුරු විමසීමක්, සියුම් විචක්ෂණයක් හා විශ්ලේෂණයක් කර නිගමන වලට එළඹීම මෙහි දී සිදු වේ.

උදා:-

එකම ළමයෙක් දිගින් දිගටම (ජීව විද්‍යාත්මකව, සමාජ විද්‍යාත්මකව, අධ්‍යාපන විද්‍යාත්මක ආදී විවිධ ඇයුරෙන්) දිගු කාලයක් තිස්සේ කරන අධ්‍යයනයක් මෙමගින් සිදු වේ.

එවැනි අධ්‍යයනයක් තුළ දරුවෙකුගේ අනාගත අභිමතාර්ථ සඵල කිරීම උදෙසා ඉතාම ක්ෂුද්‍ර (Micro) දැනුවත් කිරීම් කරගන්නට අපට හැකියාව ඇතිවේ. ආරම්භයේදී ඔබ නොදැන සිටි බොහෝ දෑ මෙමගින් අධ්‍යයනය කළ හැකිය. දිගු කාලයක් ගත වුවත් ඉන් ලැබෙන දත්ත තවත් අධ්‍යයනයකට මග පෙන්වයි.

මෙන්න ක්‍රමවේදය.

- ප්‍රත්‍යක්ෂය තෝරා ගන්න.
- දත්ත රැස්කර ගන්න.
- දත්ත විශ්ලේෂණය කරන්න.
- දත්ත අර්ථකථනය කරන්න.
- වාර්තා ගත කරන්න.




**"ගුරුවරයා සද්භාවයේ ප්‍රතිමූර්තියකි. දරුවන් වෙනුවෙන් තම දිවිය කැපකරන්නෙකි. මෙම ක්‍රමවේද සිතට ගෙන පාසල තුළ, පන්ති කාරමය තුළ අත්හදා බලමින් දරුවන්ගේ අධ්‍යාපනයට මග පෙන්වන්න.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**පූජිත ගුරුභවතෙක් වෙන්න. නිතරම රටට වැඩදායක පුරවැසියන් බිහිරන්නේ ඔබ බැවින් නිරහංකාර ආඩම්බරයක් ලබන්න."**

## 2.5 ළමා සංවර්ධනයට ආරය හා පරිසරයේ බලපෑම.

කසුනි:- ළමා සංවර්ධනය කෙරෙහි බලපාන්නේ ආරය ද?

කවිෂ්ක:- ළමා සංවර්ධනය කෙරෙහි බලපාන්නේ පරිසරය ද?

මිෂාරා:- නෑ නෑ ආරයයි පරිසරයයි දෙකම.

දේශාන්:- සමින්ද අයියේ, ඔයා හිතන්නේ කොහොමද ?

සමින්ද:- අපි විවාදයක් කරමුද? හැබැයි ඊට ඉස්සර වෙලා කරුණු ටිකක් හොයමු. යමු පුස්තකාලයට - ඒවා මනෝවිද්‍යාව පොත්වල ඇති.

### ආරය

පුද්ගලයකු සතු ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණයවීමත්, ඒවා පිළිසිඳ ගැනීමත් සමගම තහවුරු වන බවත්, මගින් පුද්ගලයකු සතු යහපත් මෙන්ම අයහපත් ලක්ෂණ ඒවායින් කරන්නා වූ තීරණාත්මක සාධකය 'ආරය' නම් වේ.

හෙවත්,

ජීවීන්ගේ මානසික හා ශාරීරික ගති ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරවන ජීව විද්‍යාත්මක ක්‍රියාවලියකි. ආරමය ගුණාංග නිශ්චය වනුයේ මව හා පියාගෙන් උරුමවන ජාන සම්බන්ධ වීමෙනි.

### ආරයෙහි බලපෑම-

- ✓ පුද්ගලයන්ගේ කායික අංග ලක්ෂණ කෙරෙහි (කෙස්වල වර්ණය,හැඩය,සමේ පාට, මුහුණේ අංග ලක්ෂණ, ඇස්වල වර්ණය, උස)
- ✓ පුද්ගලයන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි.
- ✓ සමහර ලෙඩ රෝගවල බලපෑම කෙරෙහි (දියවැඩියාව,මානසික රෝග, චිත්තවේග, මානසික පීඩා)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com
Iscolee.blogspot

## 'ළමයාගේ සංවර්ධනය සිදුවීම ආරය බලපායි'

## ගවේෂණය මගින් සනාථ කිරීම්.

### කාල් පියර්සන්ගේ මතයඃ-




පුද්ගලයකු තුළ ශාරීරික හා මානසික ආරමය ලක්ෂණ සමානව පිහිටයි. චරිතමය ගුණාංග නිවසේ පරිසරය පවා සකස් වන්නේ ආරමය බලපෑම මතයි.

### ලැමාර්ක්ඃ-



දෙමාපිය ගතිගුණ පාරම්පරිකව, දරුවන්ට උරුමවන දෙයකි.

සමාජ විරෝධී ක්‍රියාවලට ආරය බලපාන ආකාරය ගැන නිව්යෝර්ක් හි 'ජුක්' පවුල අලලා කරන ලද පරේෂණය ඇසුරෙන්, ජුක් පරම්පරාවේ බොහෝ අය බේබද්දන්, සිඟන්නන්, ගණිකාවන්, අපරාධරුවන් බව අනාවර්ණය වී ඇත.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පරිසරය ද?

දරුවාගේ ජීවිතය හා බැඳී ඇති බාහිර උත්තේජක සියල්ල පරිසරය නමින් හැඳින් වේ.

පරිසරය




1. සමාජ පරිසරය - පුද්ගලයා ඇසුරු කරන සාමාජිකයන්.

2. භෞතික පරිසරය - අනෙකුත් වටපිටාව.

**ස්කිම්ඩ්**

සමාජ සංවර්ධනයට හිතකර පරිසරයක් සම්පාදනය කර දුන් අවස්තා වල ළමුන් වැඩි දෙනෙක් යහපත් සංවර්ධනයකට හිමිකම් දක්වති.

**වුඩ්වර්ත්**

පිළිසිඳ ගැනීමෙන් පසු බලපාන හැම සාධකයක්ම පාරිසරික සාධකයි. ජිවියාට මුලුන්ම හමුවන පරිසරය, මව්කුසයි. මවගේ පෝෂණ තත්ත්වය, මවට වැළඳෙන රෝග, විකිරණයට භාජනය වීම, මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් දරුවාගේ කායික රෝගී බව හා ඉන්ද්‍රිය දුර්වලතා ඇති කරවයි.

මවගේ මානසික සුරක්ෂිත බව, සමතුලනය, සමාජ පරිසරයේ සහනශීලී බව චිත්තවේගී හා මානුෂික සමබරතාව ඇති කරවයි. මෙය දරුවාගේ මානසික සුවය හා කායික දුබලතා වළක්වයි.


**වොට්සන්**

ඕනෑම නව ජීවියෙකු සුදුසු පරිසරක ඇති දැඩි කිරීමෙන් උගතෙකු, වෛද්‍යවරයෙකු, සංගීතඥයෙකු වැනි අපේක්ෂිත තත්ත්වයකට පත් කරගත හැකි ය.

පරිසර දෙකක වෙන්කොට ඇති දැඩි කරන ලද අනන්‍ය නිවුන් දරුවන්ගේ බුද්ධියේ වෙනස්කම් ඇති බව පර්යේෂණ මගින් තහවුරු කොට ඇත .


**ජෝන් ලොක්**

ළදරුවා උපත ලබන විට මනස පිරිසිදු ගල්ලෑල්ලක් බඳුය. අප ලබා ගන්නා සියලුම දැනුම් පසුව පරිසරයෙන් එකතු වෙන දෑ ය.



රූසෝ

ළමයා ස්වභාවයෙන් ම යහපත් බවත් ඔහු නරක් වන්නේ පරිසරය නිසා බවත්ය. පරිසරයම ළමයාගේ අධ්‍යාපනය වන බවත්, ළමයාගේ ජීවිතය පවා පරිසරයට අනුව වෙනස් කළ හැකි බව පවසයි.



## ආරය හා පරිසරය?

### සාමාන්‍ය පිළිගැනීම

¶ ආරය හා පරිසරය යන දෙකෙන්ම අන්‍යොන්‍ය බලපෑම මත ළමා සංවර්ධනය සිදුවෙයි.

ජීවියාගේ ශාරීරික සාධක වැඩි වශයෙන් ආරයෙන් ද ඉගෙනීම බුද්ධිය වැනි පෞරුෂ සාධක පරිසරයෙන් ද ලැබේ.'

### වුඩ්වර්ත් හා මාර්ච්ක්

'පුද්ගලයා යනු ආරයෙත් පරිසරයේත් එකතුවක් නොව ගුණිතයකි.

එනම් ආරයේ හා පරිසරයේ අන්‍යොන්‍ය බලපෑම නිසා ඇතිවන ප්‍රතිඵලය පුද්ගලයාය. ආරයෙන් උරුම කරගත් ප්‍රමාණය පරිසරය හා ගැටීමෙන් වැඩි වේ.'



ළමයින් පරිසරයට ගොඩක් කැමතියි.

හරියට මේ මෙන්න මේ වාගේ

Click

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 2.6 විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනා ගැනීම





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.1 විශේෂ අවශ්‍යතා ඇති සිසුන් යනු කවුරුන්ද?

ඔබේ පන්තියේ සාමාන්‍ය ළමයින්ට වඩා වෙනස් විශේෂ ගැටලු හා සාමාර්ථතා ඇති ළමයා මේ ගණයට අයත් වේ.

ඔන්න... Click කර බලන්න.

සාම්ප්‍රදායික නිර්වචනය නම්,

**''ප්‍රමාණයෙන් විශාල ලෙස උපකාර ලබාදිය යුතු ළමයින්, ආබාධිත හෝ දුර්වලතාවලින් පෙළෙන හෝ ඌනතා සහිත හෝ විශේෂ ළමයින් වේ.''**

නමුත් නූතන නිර්වචනයට අනුව,

**''සියලු ළමයින්ට පොදු වූ අවශ්‍යතාවලට අමතරව විශේෂ වූ අවශ්‍යතා ද ඇත. මේ අනුව සියලු ළමයින් විශේෂ අවශ්‍යතා සහිත ළමයින් ලෙස සැලකේ.''**

විශේෂ අවශ්‍යතා ඇති ළමයි ප්‍රධාන කොටස් තුනකට වර්ග කර දක්වයි.


- ආබාධිත ළමයි (Handicapped)
- චර්යා අක්‍රමතා ඇති ළමයි (Behavioral Disorders)
- සුභග (Gifited)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ගුරුවරයා වන ඔබ විමසිලිමත් වෙන්න.අදාළ සිසුන් හඳුනා ගන්න.
මෙය සත්කාරයක්. ඔබ හදවත සුවපත් කරන්නෙක්.......
අනාගතයට මඟ පෙන්වන්නෙක්....

## 2.6.2
## විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වර්ග කරමු.




මෙම සුළුතරය විශේෂ අවශ්‍යතා ඇති ළමයි
**(Children With Special Needs )** ලෙස නම්කර හඳුනාගෙන ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.3 විශේෂ අවශ්‍යතා තත්ත්වයන් කිහිපයක්.

### 2.6.3.1 දෘශ්‍යාබාධිත

- ✓ දුර නොපෙනෙන
- ✓ ළඟ නොපෙනෙන
- ✓ අන්ධ

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරම මෙවැනි ශිෂ්‍යයන් හඳුනාගන්න.

මෙන්න ලක්ෂණ:-

- **කියවීමේ දී ලිවීමේ දී ඇස ළඟට පොත ගෙන ඒම හෝ ඈත් කිරීම.**
- **ළඟ ළමයාගේ පොත දෙස බලා ලිවීම.**
- **කළු ලෑල්ලේ ඔබ ලියූ දෙය පිටපත් කර ගැනීමට අපහසුතාවය.**
- **කළු ලෑල්ල අසළටම ගොස් බලයි.**
- **ඇස් කුඩා කරයි, ලොකු කර බලයි, කඳුළු ගලයි.**
- **නිතරම හිසරදය**
- **ලොකු අකුරු ලියයි, පිල්ලම් අඩුයි.**

ඔබට උපදෙස්:-

- දෙමාපියන් හෝ භාරකරුවන් දැනුවත් කරන්න.
- ඇස් කණ්ණාඩි ලබා ගැනීමට යොමු කරවන්න.
- ඉදිරි පේළියක වාඩි කරවන්න.
- පොත්,කියවීම හා ලිවීම ගැන වරින්වර සොයා බලන්න.
- ශිෂ්‍ය අභිමානය ගොඩනංවන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.3.2 ශ්‍රව්‍යාබාධිත

ආරමය හෝ පූර්ව ප්‍රසව අහිතකර බලපෑම් හෝ ළමා කාලයේ අනතුරුදායක ක්‍රියාවල යෙදීම නිසා හට ගනියි.

- උපතින් බිහිරි
- මන්ද ශ්‍රවණාබාධිත

ඔබේ පන්ති කාමරයේ ශිෂ්‍යයෝ සිහිකර ගන්න.

- ✓ සිහින් ශබ්ද නොඇසෙන - මඳ ඌණතාව
- ✓ සාමාන්‍ය කතාබහ ඇසෙන - තරමක් ඌණතාව
- ✓ උස් ශබ්ද පවා නොඇසෙන - බොහෝ දුරට ඌණතාව
- ✓ මහත් හඬින් කෑ ගැසුවත් ශබ්ද නොඇසෙන - ප්‍රබල ඌණතාව
- ✓ තදබල ශබ්ද නොඇසෙන - ඉතා ප්‍රබල ඌණතාව

ගුරුන් වන ඔබ ශ්‍රවනාබාධිත ළමුන් හඳුනාගන්න, ශිෂ්‍ය චර්යා මෙසේ නිරීක්ෂණය කරන්න.

- ❖ ඔබ දෙසට එක් කණක් යොමු කරයි.
- ❖ කතා බහට එක් කණක් පමණක් යොමු කරයි.
- ❖ කියවන විට ලියන විට නැවත නැවත අයයි.
- ❖ ළඟ සිටින ළමයාගේ පොත පලා ලියයි.
- ❖ පෙර නොඇසූ වචන වැරදි ලෙස උච්චාරණය කරයි.
- ❖ ටිකක් මුරණ්ඩුයි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Iscolee.blogspot

## එවැනි ශිෂ්‍යයන් මුණ ගැසුණොත් ඔබ කළ යුතු දෑ.......

- දෙමාපියන් දැනුවත් කරන්න.
- ඉදිරි පේළිවල වාඩි කරවන්න.
- කතා කරන විට ගුරුවරයාගේ තොල් සෙලවෙන ආකාරය දකින්නට සලස්වන්න.
- රූප සටහන් දෘශ්‍යාධාර වැඩිපුර පාවිච්චි කරන්න.
- අන්‍ය ගුරුවරු දැනුවත් කරන්න.
- වෛද්‍ය උපදෙස් ලැබුමට යොමු කරවන්න.
- තදබල ඌණතා ඇත්තොත්, උචිත තැන් වලට යොමුකරවන්න.

  ශ්‍රී ලංකා බිහිරි ආයතනය

  ශ්‍රියා පදනම

  සිංහ සමාජය

- ශිෂ්‍ය ආත්ම ගෞරවයට හානියක් නොවෙන්න කටයුතු සැලසුම් කරන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඔබ අපට මෙහෙම කියනවා....

'11 ශ්‍රේණියෙත් අකුරු ලියන්න බැරි ළමයි ගොඩාක් ඉන්නවා'

'කොච්චර කියලා දුන්නත් ලියන්නෙ අකුරු කැලි.....'

## 2.6.3.3 නියුරෝෂියා තත්ත්වයක් වන ඩිස්ලෙක්ෂියාව.

කායික,මානසික වර්ධනයේ ගැටලුවක් හා සාමාන්‍ය බුද්ධිමය අඩුපාඩුවක් නොමැතිව ද අකුරු හා වචන භාවිතා කර කියවීම් දුබලතා නිසා අධ්‍යාපනික කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාමට නොහැකි වීමෙන් හටගන්නා රෝගීමය තත්ත්වයකි.

මෙය මොළයේ වර්ධනයේ කිසියම් ඌණතාවක් හේතු කොට ගෙන අකුරු, ඉලක්කම් මගින් දෙන සංඥා මොළය විසින් නිසියාකාරව හඳුනා නොගැනීම හා ප්‍රතිචාර දැක්වීමේ අඩුපාඩුවක් මත සිදු වේ.

කියන විට ලියන විට එහි අර්ථය වටහා ගෙන එහි මනෝචිත්‍රයක් ගොඩ නොගැනීම ප්‍රධාන රෝග ලක්ෂණය වේ.

### ඩිස්ලෙක්ෂියාව - ඉගෙනුම් ගැටලු

- අනවධානය හා අමතක වීම.
- හොඳින් දන්නා වචන පවා උච්චාරණයට බොහෝ වේලාගැනීම.
- අනුමානයෙන් වැරදි ලෙස වචන කීම.
- අකුරු හැඩ සංජානනය නොවීම.
- අකුරු හැඩය විකෘතියි, අකුරු කැලි ලියයි, අකුරු අත හැර ලියයි.



- අර්ථය අවබෝධ නොවීම.
- කියවීම අතිශයින් දුර්වලයි.

මෙම රෝගී තත්ත්වය ආරමය තත්ත්වයක් වුවද ගුරු භවතුන් වන අපට නොසලකා සිටිය නොහැකිය. මඟහැර යාමට නොහැකිය. සූදානම් වෙමු අපි මෙලෙස එවැනි දරුවන්ට හැකි පමණින් අකුරු කරන්නට.

- මේ ළමයින් හඳුනාගන්න. රෝගය විනිශ්චය කරගන්න.
- සුවිශේෂ ක්‍රමවේද තුළින් දරුවාට ළඟා වෙන්න. විශ්වාසය දිනා ගන්න.
- ක්‍රීඩා කටයුතු වල ලැදි මොවුන්ට, නිර්මාණශීලි ක්‍රියාකාරකම් එකතු කොට පැවරුම්පත් සකස් කරන්න.
- එදිනෙදා වැඩ කටයුතුවලට දක්ෂ මොවුන්ගේ ප්‍රබලතා මතුකොට ගන්න.
- අගයන්න.
- කොන් නොකරන්න.
- ''කළ හැකියි'' යන බව ඒත්තුගන්වන්න.

වැඩිපුරම ඔබට මුහුණපාන්නට වන අවස්ථාවක්.
Click

**ලකුණු වලට දේවත්වයෙන් පුදන සමාජයක අඩු ලකුණු ගන්න ශිෂ්‍යයා ගුරු-දෙමාපියන්-සමවයස් අයගෙන් කොන් වේ. සමාජිකත්වය ප්‍රතික්ෂේප කරයි. සමාජ කුසලතා වර්ධන අඩු වේ. ඉච්ඡාභංගත්වය වැඩිවීමෙන් සියදිවි නසා ගැනීමට ද පුළුවන. ඔබට හැකි උපරිමයෙන් මෙවැනි දරුවන් දෙස බලන්න.**




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.3.4 ඉගෙනුම් ආබාධිත බව.

**හෙමින් ඉගෙන ගන්නා ළමයින් ඔබේ පන්ති කාමරයෙන් මුණ ගැසුනාද?**

මොවුහු :-

- ✓ **තමා සිටින පන්තියේ ළමයින්ට වඩා ඉතා අඩු ශාස්ත්‍රීය සාමාර්ථතාවක් දක්වන්නේ ය.**
- ✓ **දිගටම අඩු ලකුණු ලබයි.**
- ✓ **කායික දුබලතා ඇත.**
- ✓ **විෂයයට පෙළඹවීම අඩුයි.**
- ✓ **විභාග වලදී දක්ෂතා නොදක්වයි.**
- ✓ **ප්‍රයෝගික විෂයයන් වලට ලැදියි.**



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

පාසල යනු ඔබ කරා පැමිණෙන ළමුන්ගේ ශාස්ත්‍රීය සමාර්ථතාව පමණක් පෙන්වන තැනක් නොවන බව සිත්හි තබා ගන්න.

## අපි ඉගෙනුම් ආබාධිත ළමයින්ට උදව් කරමු.

(ඔවුහු සෙමෙන් උගනෙති.)

ඔබේ පන්තියේ සෙමෙන් ඉගෙන ගන්නා සිසුන් (Slow Learners) හඳුනා ගන්න.

- පොදු ඉගැන්වීම් සිදු කරන්න. - නමුත් මෙවැනි ළමුන්ගේ දක්ෂතාවට සරිලන හැකියාවක් බලාපොරොත්තු වීම ප්‍රමාණවත් බව හිතට ගන්න.
- වසර ගැන නොසිතන්න ඔහුට/ඇයට ගැලපෙන වැඩ වෙනම සැලසුම් කරන්න.
- ප්‍රතිකාර්ය ඉගැන්වීම් අරඹන්න.
- එම සුවිශේෂී ඉගැන්වීම් පිළිබඳව විදුහල්පති, දෙමාපියන් දරුවාගේ අභිමනයට හානියක් නොවන්න දැනුවත් කරන්න.
- දක්ෂතා අගය කරන්න. පිළිගෙන ප්‍රශංසා කරන්න.
- අසමත් නොකරන්න - අසමත් වුවහොත් වසර කිහිපයක් ඔවුහු චිත්ත පීඩා හා සාංකාමය තත්ත්වයට පත්ව පරාජිත මානසිකත්වයකට පැමිණෙන බව සිහි තබා ගන්න.



සෙමින් ඉගෙනගන්නා දරුවාට අපි උදවු කරමු.
Click

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

විෂයය තුළින්-





- ✓ සෙමෙන් ඉගෙන ගන්න සිසුන්ට - අවශ්‍යම විෂයය කරුණු (සාරය,හරය)
- ✓ මධ්‍යම සිසුන්ට - විස්තර සහිත විෂයය කරුණු උදාහරණ ඇතිව
- ✓ දක්ෂ / විශිෂ්ට සිසුන්ට - පුළුල් විස්තරාත්මක කරුණු, කුතුහලයට ප්‍රශ්න වලට උදවි කළ යුතුයි.

ඔබ හිතුවොත් දරුවා වෙනුවෙන්

ගොඩක් දේවල් කරන්න පුළුවන්.

Click



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.3.5 සුහග ශිෂ්‍යයා


- හැකියා දක්ෂතා කුසලතා වැනි ලක්ෂණ වලින් අන් අයට වඩා කැපී පෙනෙන දක්ෂ සිසුන් ය.
- බුද්ධි ඵලය ඉහළය. (130ට වැඩි)
- ගුරුවරුන්, ඔබ මෙවැනි දරුවන් හරි හැටි හඳුනා නොගතහොත් පන්ති කාමරයේ දී ඔවුහු අතෘප්තිමත්ව, නොසන්සුන් බවට පත්වෙති.කළකිරෙති. ඉච්ඡාභංගත්වයට පත් වෙති. එහෙයින් ඔබ ඔවුනට විශේෂිත ඉගෙනුම් අවශ්‍යතා සැපයිය යුතු වෙයි.
- ජනගහනයෙන් 2% - 3% දක්වා ඇති සීමිත පිරිසකි, සුහග




- මෙවැනි සිසුන්ගේ විභව ශක්තීන් උපරිම අයුරින් විකසිත කළ යුතුයි.
- සංවර්ධිත රටවල සුහගයින් සලකුණු ලබන්නේ රටට වාසනාවක් වශයෙනි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com






Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 2.6.3.6 විශේෂ අවශ්‍යතා ඇති ළමයි පිළිබඳව

### ගුරු අධ්‍යාපනඥයන් වන අපෙන් ඔබට උපදෙසක්......

- ඇතැම් ශිෂ්‍යන්ගේ විශේෂතා, අවශ්‍යතා ආකූලතා හා විශිෂ්ටතා සාමාන්‍ය මට්ටමට වඩා දුරස්ත වේ නම් ඔවුන් සඳහා විශේෂ ආයතන, විශේෂ පුහුණුකරුවන් හා විශේෂ ඉගැන්වීම් ක්‍රම භාවිත කරන්න.
- මෙවැනි ළමයෙකු පාසලට නොගැලපේ යැයි ප්‍රතික්ෂේප කිරීමේ අයිතියක් හෝ හැකියාවක් කිසිවෙකුටත් නැත.
- අන්තර්කරණ අධ්‍යාපනය යටතේ, විශේෂ අවශ්‍යතා ඇති ළමයින් වෙනම ආයතන වලට ඇතුළත් කර ඉගැන්වීමට වඩා සාමාන්‍ය මට්ටමේ ළමයින්ට මුහුකළ විට උගෙනුම් අත්දැකීම් ඉක්මනින් ලැබෙන බව අධ්‍යාපනඥයන්ගේ අදහසයි.
- ඔබ තුළ විශේෂ අවශ්‍යතා ඇති ළමයින් හඳුනා ගැනීමට හා ඔවුන් සමඟ කටයුතු කිරීමට යෝග්‍ය මානසික ආකල්ප ගොඩනගා ගන්න.

**<u>මන්ද පහත සඳහන් ආකාරයට ඊටත් ඔබ්බට ඔබ ගුරු භූමිකාව තුළ ගනුදෙනු කළ යුතු බැවිනි.</u>**





<u>ඔබත් මෙවන් ගුරුවරයෙක් වන්න.</u>

<u>Click</u>

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## තවදුරටත් ඔබ පහත සඳහන් පොත් පත් අධ්‍යයනය කරන්න.


1. අතුකෝරල ඩී.ආර්. සහ අතුකෝරල එච්. එන්.,අධ්‍යාපන මනෝ විද්‍යාව හා ගුරුවරයා. ශික්ෂා මන්දිර ප්‍රකාශන,පානදුර.
2. ගජවීර ජේ., පන්ති කාමර කළමනාකරණය
3. වික්‍රමසිංහ චිල්., කාර්යක්ෂම හා ඵලදායී ගුරුවරයකු වීමට නම්
4. කලුආරච්චි කේ.ඒ..එස්.පී., කළමනාකරණය 2000, කර්තෘ ප්‍රකාශන
5. කස්තුරිආරච්චි. සී., අධ්‍යාපන කළමනාකරණය 2009
6. කොතලාවල .චල්.සී., පියාජේගේ මනෝවිද්‍යා න්‍යාය (1979) ලේක් හවුස්, කොළඹ.
7. ජනාධිපති කාර්ය සාධන බලකාය (1997) , සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
8. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව (2003), ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාති ප්‍රතිරාමුවක් සඳහා යෝජනා.
9. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය.
10. Transforming school Education in sri lanka 2011 The World bank,Colombo Office
11. අබේපාල රෝලන්ඩ්, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.

## මොඩියුල අංක 03 ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස්

- මොඩියුල අංක 03 "පන්ති කාමර කළමනාකරණය හා ශිෂ්‍යයා හඳුනාගැනීම" 01 හා 02 කොටස් ස්වයං අධ්‍යයනය කිරීමට මධ්‍යස්ථානයට අභිමත පරිදි කාලය දිය හැකිය.
- 01 හා 02 කොටස් අධ්‍යයනය තුලින් ලබා දිය යුතු පැවරුම් ඇමුණුම් තුළ ඇත.
- අදාළ 01 හා 02 කොටස් දෙකක් සඳහා එක කොටසකට ලකුණු 25 බැගින් මුළු ලකුණු 50 යි.
- ලිඛිත විභාගයට කෙටි ප්‍රශ්න 25ක් සඳහා ලකුණු 02 බැගින් මුළු ලකුණු 50යි.
- ලිඛිත විභාගයට පෙනී සිටීමට පැමිණෙන විට සකස් කළ පැවරුම් 02 රැගෙන ඒමට සලස්වන්න.

Iscolee.blogspot




ගුරු මොඩියුල 3

මොඩියුල පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා

අපගේ Facebook සමූහය සමග සම්බන්ධ වන්න




ඉස්කෝලේ...

iscoleeblogspot@gmail.com